# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 14,929 — 1970 ඔක්තෝබර් 23 වැනි සිකුරාදා — 1970.10.23**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — | ආණ්ඩුවේ නිවේදන ... | 773 |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය ... | 771 | මිළ පාලන දැන්වීම් ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරණ පත් කිරීම් ආදිය ... | — | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... | 782 |
| වෙනත් පත් කිරීම් ආදිය ... | 772 | ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... | — | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... | 790 |
| | | "සුරාබදු ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... | — |


**සැලකිය යුතුයි.**—මෙවර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයේ VI වැනි කොටසේ ජූරි සභිකයන්ගේ සහ උපදේශක වරුන්ගේ නාම ලේඛනයක් පලවේ.

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය

ආංකය : ඩී. 17/ආර්ජ්සීපී.

**1970 අංක 344**

### යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද පත්කිරීම් අත්හැරයාම් සහ පත්කිරීම්

පත්කිරීම් අත්හැරයාම

යුද්ධ හමුදා ආඥාපනතේ (357 වැනි අධිකාරය) 13(1) වගන්තිය යටතේ පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් පෙන්වා ඇති දිනයන් සිට ආධුනිකයින් බඳවන නිලධාරි තනතුර අත්හරින ලදී :—

මේජර් මාක් ඇන්තනී පෙරේරා සමරසිංහ, ලපාහ—1970 ජූලි මස 12 වැදි දින.

තාවකාලික මේජර් හෙට්ටිආරච්චි ග්‍රේෂන් හැරී ගුණවර්ධන, ලංඉ.—1970 අගෝස්තු මස 1 වැනි දින.

කපිතන් රසිල් ලොයිඩ් විජේසිංහ, ල.යු.සේ.බ.—1970 මාර්තු මස 18 වැනි දින.

පත්කිරීම්

යුද්ධ හමුදා ආඥාපනතේ (357 වැනි අධිකාරය) 13(1) වගන්තිය යටතේ පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් පෙන්වා ඇති දිනයන්හි සිට ආධුනිකයින් බඳවන නිලධාරීන් වශයෙන් :—

කපිතන් වඩුගේ මිත්‍රරත්න වීරසූරිය, ලංඉ.—1970 අගෝස්තු මස 1 වැනි දින.

ලුතිනන් තිලකපාල රත්නසේකර, ල.යු.සේ.බ.—1970 මාර්තු මස 18 වැනි දින.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ඔක්තෝබර් 13 වැනි දින,
කොළඹ දීය.

10-867

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශෙෂ නිවේදනයයි**

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.**

1970 ජූනි 2 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව,
**කොළඹ.**

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

**1970 අංක 345**

අංකය ඩී. 21/ආර්ඊසීපී/385.

## යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් පිළිගන්නා ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

1970 නොවැම්බර් මස 1 වැනි දින සිට, යුද්ධ හමුදාව ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරියාගේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් පිළිගන්නා ලදී.

කපිතාන් හපන්ගම ආරච්චිගේ සරත් වික්‍රමසූරිය, ල.ඉ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 ඔක්තෝබර් 5 දින,
කොළඹ දී ය.

10-709

---

**1970 අංක 346**

අංකය : ඩී. 251/ආර්ඊසීඑෆ්/4.

## රාජකීය ලංකා නාවික හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

1970 අගෝස්තු මස 7 වෙනි දින සිට කොමාන්ඩර් පදවියට :

ලුතිනන් කොමාන්ඩර් (ඊ) ඇල්ෆ්‍රඩ් විලියම් හෙන්රි පෙරේරා ර.ලං.නා.හ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 ඔක්තෝබර් 5 දින,
කොළඹ දීය.

10-813

---

**1970 අංක 347**

අංකය : ඩී. 22/ආර්ඊසීපී/173.

## රාජකීය ලංකා නාවික හමුදාව—ස්ථිර නාවික හමුදා සේවයේ සිට ස්ථිර නාවික උප සේවයට නිලධාරීන් මාරු කිරීම

පහත නම් සඳහන් නිලධාරියා 1970 අගෝස්තු මස 1 වැනි දින සිට ස්ථිර නාවික හමුදා සේවයේ සිට ස්ථිර නාවික උප සේවයට මාරු කිරීම අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කොට ඇත :—

ලුතිනන් (නැ.කා.) ඩී. ඩී. වික්‍රමනායක, ර.ලං.නා.හ. (විශ්‍රාමලත්)

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 ඔක්තෝබර් 5 දින,
කොළඹ දීය.

10-812

---

# වෙනත් පත් කිරීම් ආදිය

### සංශෝධනයයි

අංක : ජීඑ/ඒ—2.

1970 සැප්තැම්බර් මස 11 වැනි දින හා අංක 14,923 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි 1 වැනි කොටසේ (1) වැනි ඡේදයෙහි 673 හා 674 වැනි පිටුවල ප්‍රසිද්ධ කරන ලද 1970 අංක 296 දරණ ගැසට් නිවේදනය, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කට යුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් විසින් පහත දැක්වෙන පරිදි සංශෝධනය කර ඇත.

"කොළඹ පාලන දිස්ත්‍රික්කය භාර වැඩබලන ආණ්ඩුවේ ඒජන්ත, ඩී. ඩබ්ලිව්. ද අල්විස් මහතා, 1970 ජූලි මස 4 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, ස්වකීය රාජකාරිවලට අතිරේකව බස්නාහිර පළාතේ පිස්කල් සහ කොළඹ පාලන දිස්ත්‍රික්කයේ ජ්‍යේෂ්ඨ අයකැමි."

යන පත්වීම අවලංගු කොට ඒ වෙනුවට,

"කොළඹ පාලන දිස්ත්‍රික්කය භාර වැඩබලන ආණ්ඩුවේ ඒජන්ත, ඩී. ඩබ්ලිව්. ද අල්විස් මහතා, 1970 ජූලි මස 4 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, ස්වකීය රාජකාරිවලට අතිරේකව, බස්නාහිර පළාතේ පිස්කල්."

යන පත්වීම ආදේශ කරනු ලැබේ.

ඩබ්ලිව්. ආර්. පී. තිලකරත්න,
ස්ථිර ලේකම් වෙනුවට.

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
ටොරිංටන් චතුරශ්‍රය,
කොළඹ 7,
1970 ඔක්තෝබර් මස 10 වනි දින.

10-737

---

**1970 අංක 348**

## නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

දේවලක්ෂමී බාලසුන්දරම් මහත්මිය කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත් කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ සවදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ක් වූ සැප්තැම්බර් මස 23 වැනි දින,
කොළඹ දීය.

10-711

---

**1970 අංක 349**

## නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

සෝමපාල දිසානායක මහතා ගම්පහ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත් කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ක් වූ සැප්තැම්බර් මස 23 වැනි දින,
කොළඹ දීය.

10-712

---

**1970 අංක 350**

## නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

සුසන්ත මහේස් මුණසිංහ මහතා පානදුර අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත් කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ක් වූ සැප්තැම්බර් මස 23 වැනි දින,
කොළඹ දීය.

10-713

# ආණ්ඩුවේ නිවේදන

## මුද්දර ආඥාපනත

(247 අධිකාරය වන) මුද්දර ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ මුදල් ඇමතිවරයා විසින් පනවන ලද ව්‍යවස්ථාව.

ඇන්. ඇම්. පෙරේරා,
මුදල් ඇමති.

1970 ඔක්තෝබර් මස 16 දින.
කොළඹ දීය.

### ව්‍යවස්ථාව

(247 අධිකාරය වන) මුද්දර ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ පනවා අංක 14,707 සහ 1966 අගෝස්තු 5 දින දරණ ගැසට් පත්‍රයේ පළකරනු ලැබ, අංක 14,925 සහ 1970 සැප්තැම්බර් 25 දින දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද ව්‍යවස්ථාවෙන් අන්තිමවරට සංශෝධිත ව්‍යවස්ථාව, ඊට යාකොට ඇති උපලේඛනයෙහි 82 වන විෂයයට ඉක්බිතිවම පහත සඳහන් අළුත් විෂයය ඇතුළත් කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

"83. එක්සත් ජාතීන්ගේ ලාංඡනය සහ සාමය නිරූපනය කරන පරෙවියෙක් සහ ප්‍රගතිය විදහා දක්වන වැඩිවන දිගින් යුතු ඉරි රැසක් පිළිබිඹු කැරෙන රුපියල් දෙකේ වටිනාකමෙන් යුත් තැපැල් සහ ආදායම් මුද්දර."

10-873

## මිල පාලන ආඥාව

නියෝජ්‍ය මිල පාලක (විවිධ ද්‍රව්‍ය) අයි. ඕ. කේ. ජී. ප්‍රනාන්දු විසින් පනවනු ලැබ, 1970 සැප්තැම්බර් මස 30 වන දින අංක 14,925/5 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ, (විවිධ ද්‍රව්‍ය) මිල පාලනයට අදාල පහත සඳහන් ආඥාවන්, විදේශීය හා දේශීය වෙළඳ ඇමතිවරයා විසින් අනුමත කරනු ලැබූ බව (173 වැනි අධිකාරය වන) මිල පාලන පනතෙහි 4 (7) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදන කරනු ලැබේ :—

(1) 1970 අංක 1 දරණ (දන්තාලේප ටියුබ්) මිල පාලන ආඥාව.

(1) 1970 අංක 1 දරණ (විදුලි පන්දම් බැටරි සහ ට්‍රාන්සිස්ටර් රේඩියෝ බැටරි) මිල පාලන ආඥාව.

(3) 1970 අංක 1 දරණ (කුඩ) මිල පාලන ආඥාව.

(4) 1970 අංක 1 දරණ (බයිසිකල් ටයර් හා ටියුබ්) මිල පාලන ආඥාව.

ජ. බ. කැලේගම,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 ඔක්තෝබර් මස 5 දින,
කොළඹ දීය.

10-714

---

ඇල්.ඩී.—බී. 63/51

## ලංකා දුම්රිය නිල ඇඳුම් සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනත

ලංකා දුම්රිය නිල ඇඳුම් සේවා අර්ථසාධක අරමුදල නැමැති නීතිගත සංස්ථාව විසින් (284 වැනි අධිකාරය වන) දුම්රිය නිල ඇඳුම් සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනතේ 16 වැනි වගන්තිය යටතේ සම්පාදනය කරන ලදුව, එම වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මුදල් ඇමතිවරයා විසින් අනුමත කරන ලද ව්‍යවස්ථා.

සී. ඒ. කුරේ,
මුදල් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙනුවට.

1970 ඔක්තෝබර් 11 වැනි දින,
කොළඹ දී ය.

### ලංකා දුම්රිය නිල ඇඳුම් සේවා අර්ථසාධක අරමුදලේ ව්‍යවස්ථා

මාතෘකා නාමය

1. මෙම ව්‍යවස්ථා ලංකා දුම්රිය නිල ඇඳුම් සේවා අර්ථසාධක අරමුදලේ ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙම ව්‍යවස්ථාවන්හි පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය නොවුවහොත් "පාලක කමිටුව" යන්නෙන් අදහස් කරනු ලබන්නේ ආඥාපනතේ හතරවෙනි වගන්තිය යටතේ පිහිටුවන ලද කාරක සභාවයි. "නීති ගත සංස්ථාව" යන්නෙන් අදහස් කරනු ලබන්නේ ලංකා දුම්රිය නිල ඇඳුම් සේවා අර්ථසාධක අරමුදල යි. "ආඥාපනත" යනුවෙන් අදහස් කරනු ලබන්නේ (284 වැනි අධිකාරය වන) දුම්රිය නිල ඇඳුම් සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනතයි. "දුම්රිය සේවය" යන්නෙන් අදහස් කරනු ලබන්නේ ලංකාණ්ඩුවේ දුම්රිය සේවයයි.

සාමාජිකත්වය

3. (1) දුම්රිය සේවයේ "නිල ඇඳුම් සේවාව" යැයි හැඳින්වෙන අංශයට සම්බන්ධ දුම්රිය සේවාවේ වයස අවුරුදු 40 ලබා නොමැති සැම සේවකයෙක්ම නීතිගත සංස්ථාවේ සාමාජිකයකු ලෙස ඇතුළත් වීම සඳහා සුදුස්සකු විය යුතුය.

(2) ලේකම් සහ භාණ්ඩාගාරික තැනට අවශ්‍ය වන අන්දමින් නීතිගත සංස්ථාවේ සාමාජිකයෙකු ලෙස ඇතුලත් වීමට ඇති තම සුදුසුකම් ඔප්පු කරමින් සාමාජිකයකු ලෙස ඇතුළත්වීම සඳහා වූ සැම ඉල්ලුම්පතක්ම ලේකම් සහ භාණ්ඩාගාරික තැන වෙත යැවිය යුතු අතර ලේකම් සහ භාණ්ඩාගාරික විසින් එම ඉල්ලුම්පත් අනුමත කිරීම සඳහා පාලක කමිටුව වෙත ඉදිරිපත් කළයුතුය.

(3) එවැනි ඉල්ලුම්පතක් පිළිගැනීමේ හෝ නොගැනීමේ අයිතිය, ඊට හේතුව නොදක්වාම පාලක කමිටුව වෙත ඇති අතර එම තීරණයෙ අවසන් තීරණයද විය යුතුය.

(4) පාලක කමිටුව විසින් සාමාජිකත්වය සඳහා වූ ඉල්ලුම්පතක් පිළිගන්ට යෙදුන දිනයේ සිට, නීතිගත සංස්ථාවේ සාමාජිකත්වය ආරම්භ විය යුතුය.

නම්කළ තැනැත්තා වෙනස්කිරීම

4. (1) යම් සාමාජිකයෙකුට මෙම කාර්යය සඳහාම නියමිත ආකෘති පත්‍රයක් ලේකම් සහ භාණ්ඩාගාරික වෙත යවා ඔහු විසින් නම් කරන ලද තැනැත්තා හෝ තැනැත්තන් වෙනස් කරගත හැකි වේ.

(2) නම් කළ තැනැත්තා හෝ තැනැත්තන් වෙනස් කිරීම පාලක කමිටුව විසින් එය පිළිගත් දිනයේ සිට නිත්‍යානුකූලව බලපැවැත්විය යුතු අතර, පාලන කමිටුව විසින් එබඳු නම්කළ තැනැත්තකු පිළිගැනීමට පෙර සාමාජිකයා මියයන්ට යෙදුනේ නම් ඔහු විසින් නම්කර තිබෙන අය හෝ අයවලුන් නිත්‍යානුකූල ලෙස නම් කරන ලද තැනැත්තා හෝ තැනැත්තන් බලපැවැත්විය යුතු සහ වලංගු වියයුතු ලෙස සැලකිය යුතුය.

පාලන වියදම්

5. සැම සාමාජිකයෙකු විසින්ම එක් එක් වර්ෂයක අප්‍රේල් මාසයේදී රු. 1·50 බැගින් නීතිගත සංස්ථාවේ නඩත්තු වියදම් සඳහා ගෙවිය යුතුය.

මාසික දායක මුදල්

6. (1) සැම සාමාජිකයෙකු විසින්ම සැම මාසකදීම යටත් පිරිසෙයින් රුපියල් තුනක දායක මුදලක් නීතිගත සංස්ථාවට ගෙවිය යුතුය.

(2) වැඩි මුදලක් ගෙවීමට සතුටු යම් සාමාජිකයෙකුට යම් වර්ෂයක ඔක්තෝබර් මස 15 වැනි දිනට පෙර ලේකම් සහ භාණ්ඩාගාරික වෙත ලිඛිත දැන්වීමක් කිරීමෙන් එසේ කළ හැකිය.

(3) සාමාජිකයින් විසින් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු සියළුම මුදල් ඔවුන්ගේ අදළ වැටුප් පත්වලින්, අවකරණ මගින් අඩුකිරීම වශයෙන් අයකරගත යුතු අතර භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ට, දුම්රිය සාමාන්‍යාධිකාරිට හෝ සාමාජිකයින් සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාට එවැනි මුදල් ඉහත කී ප්‍රකාර අයකර ගැනීමට බලය තිබිය යුතුය.

(4) රෝගාබාධයකදී හෝ වෙනයම් හදිසි උවමනාවකදී යම් සාමාජිකයෙකුට ලේකම් සහ භාණ්ඩාගාරික වෙත ඉල්ලීමක් කර යම් නිශ්චිත කාල සීමාවක් වෙනුවෙන් අයකළයුතුව ඇති යම් මුදල් ප්‍රමාණයක් අයකර ගැනීම තාවකාලිකව නතර කරගත හැකි වේ.

**කාර්‍යාල වියදම්**

7. (1) පස්වැනි ව්‍යවස්ථාව යටතේ අයකර ගන්නා ලද මුදල් පාලක කමිටුව විසින් කාර්‍යාලීය වියදම් සඳහා යෙදිය යුතුය.

(2) නීතිගත සංස්ථාවේ මහසභා රැස්වීමකදී සාමාජිකයින්ගේ අනුමැතිය නොලබා, පාලක කමිටුව විසින් මොනයම් වර්ෂයක දීවත්, 5 වැනි ව්‍යවස්ථාව යටතේ අයකර ගෙන ඇති මුදල් ප්‍රමාණයට වඩා වැඩියෙන් කිසිම වියදමක් නොකළ යුතුයි.

**සේවයෙන් පහකිරීම**

8. (1) රජයේ සේවයෙන් පහකරනු ලැබූ යම් සාමාජිකයෙක් එසේ පහකරනු ලැබූ දිනයේ සිට අරමුදලේ සාමාජිකයකු නොවිය යුතු අතර මෙම ව්‍යවස්ථාවේ (2) වැනි සහ (3) වැනි ඡේදයන්හි සඳහන් ප්‍රකාර ගෙවීම් ලබා ගැනීමට ඔහුට හිමිකම් තිබිය යුතුය.

(2) වංචාවක් හෝ බීමත්කම හේතුකොට ගෙන රජයේ සේවයෙන් පහකරනු ලැබූ යම් සාමාජිකයෙකුට නීතිගත සංස්ථාවේ පොත්වල ඔහුට බැරව ඇති මුදලෙන්, නීතිගත සංස්ථාවට සහ රජයට එම සාමාජිකයාගෙන් අයවිය යුතු මුදල් අඩුකරගෙන ඉතිරි මුදල පමණක් ගෙවිය යුතුය.

(3) වංචාවක් හෝ බීමත්කම හැර වෙනත් යම් හේතුවක් නිසා රජයේ සේවයෙන් පහකරනු ලැබූ යම් සාමාජිකයකුට 19 වැනි ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුව ගණන් බලන ලද ප්‍රදාන වශයෙන් ගෙවිය යුතු මුදලින් දෙකෙන් පංගුවකින් එම සාමාජිකයාගෙන් නීතිගත සංස්ථාවට හා රජයට අයවිය යුතුව ඇති යම් මුදලක් ඇත්නම් අඩුකරගෙන ඉතිරි මුදල ගෙවියයුතුය.

**සාමාජිකත්වය අහිමිවීම**

9. (1) තමා විශ්‍රාම ගැනීම, රජයේ සේවයෙන් පහ කරනු ලැබීම, ඉල්ලා අස්වීම හෝ තමාගෙන් නීතිගත සංස්ථාවට අයවිය යුතු දායක මුදල්, ප්‍රදාන මුදල්, පොලිය හෝ නීතිගත සංස්ථාවට අයවිය යුතු වෙනත් යම් මුදලක් පිළිවෙලින් හය මසක කාලයක් නොගෙවා සිටීම හේතුකොට ගෙන සාමාජිකයෙකුට නීතිගත සංස්ථාවේ සාමාජිකත්වය අහිමි වියයුතුය.

(2) තමා වැටුප් රහිත කොට පිහිටුවාලීම, දීර්ඝ නිවාඩු ගැනීම, වැඩ තහනමකට යටත්වීම හෝ අසනීප වීම යන හේතුවක් නිසා යම් සාමාජිකයෙකුගෙන් දායක මුදල් අයකරගෙන නොතිබීම හෝ නීතිගත සංස්ථාවට දායක මුදල්, ප්‍රදාන මුදල් හෝ පොලිය වශයෙන් ලැබිය යුතු මුදල් නොගෙවා තිබීම සාමාජිකයා විසින් පාලක කමිටුව වෙත ලියවිල්ලකින් දැන්විය යුතු අතර එවැනි කරුණක් ගැන පාලක කමිටුව විසින් ගන්නා ලද යම් තීරණයක් අවසන් තීරණය වියයුතුය.

**වෙනත් දෙපාර්තමේන්තුවකට මාරුවීම**

10. (1) යම් සාමාජිකයෙක් දුම්රිය දෙපාර්තමේන්තුවෙන් වෙනයම් රජයේ දෙපාර්තමේන්තුවකට මාරුවී යැමේදී ඔහුට නීතිගත සංස්ථාවේ තම සාමාජිකත්වය, සිය අභිමතය පරිදි තබාගැනීම හෝ ඉල්ලා ඉස්වීම කළ හැකිය.

(2) යම් සාමාජිකයෙක් දුම්රිය දෙපාර්තමේන්තුවෙන් වෙනයම් රජයේ දෙපාර්තමේන්තුවකට මාරුවී යැමේදී එසේ මාරුවී යන දිනයට යටත් පිරිසෙයින් තුන් මසකට කලින් ලේකම් සහ භාණ්ඩාගාරික වෙත ලිඛිත දැන්වීමක් කිරීමෙන් ඔහුගේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්විය හැකිය. එසේ සාමාජිකත්වයෙන් අස් නොවන්නේ නම් සාමාජිකයකු වශයෙන් මෙම ව්‍යවස්ථාව යටතේ ඇති සියළුම ප්‍රතිලාභ ඉදිරියටත් ලබාගත හැකිය.

(3) දුම්රිය දෙපාර්තමේන්තුවෙන් වෙනයම් දෙපාර්තමේන්තුවකට මාරුවී යැමේ හේතුවෙන් තම සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වන යම් සාමාජිකයෙකුට ප්‍රදාන මුදලක් නොගෙවිය යුතුය. එසේ වුවත් ඔහුගේ නමට බැරව නීතිගත සංස්ථාවේ පොත්වල සඳහන්ව ඇති මුදලින් එම සාමාජිකයා විසින් ගෙවිය යුතුව ඇති මුදල් අඩුකරගෙන, ඉතිරි මුදල පමණක් ගෙවිය යුතුය.

(4) මෙම නීතිගත සංස්ථාවේ පොත්වල ඔහුට ලැබිය යුතුව ඇති මුදල් ප්‍රමාණය, ඔහු විසින් ගෙවිය යුතු මුදල් ප්‍රමාණය පියවීමට ප්‍රමාණවත් නොවන්නේ නම් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ට සහ සාමාජිකයා මාරුවීගොස් සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාට නීතිගත සංස්ථාව වෙනුවෙන් ඔහුගේ වැටුප් පත්වලින් මුදල් අයකර ගැනීමට බලය තිබිය යුතුය.

**ඉල්ලා අස්වීම**

11. (1) රජයේ සේවයෙන් ඉල්ලා අස්වී යන යම් සාමාජිකයෙකුට නීතිගත සංස්ථාවේ සාමාජිකත්වය අහිමි විය යුතු අතර, නීතිගත සංස්ථාවේ පොත්වල ඔහුගේ නමට බැරව ඇති මුදලින් එම සාමාජිකයා විසින් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු යම් මුදලක් ඇත්නම් එය අඩුකරගෙන ඉතිරි මුදල පමණක් ඔහුට ගෙවිය යුතුය.

(2) දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටියදී හෝ වෙනයම් දෙපාර්තමේන්තුවක සේවයේ යෙදී සිටියදී, යම් සාමාජිකයෙක් සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වන්නේ නම්, නීතිගත සංස්ථාවේ පොත්වල ඔහුගේ නමට බැරව ඇති සියළුම මුදල් ඔහුට අහිමි වියයුතු අතර, එම සාමාජිකයාගෙන් මෙම නීතිගත සංස්ථාවට අයවිය යුතුව ඇති සියළුම මුදල් ගෙවීමෙන් පසුව පමණක් ඔහුගේ අස්වීම වලංගු වියයුතුය.

(3) තම සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වන යම් සාමාජිකයෙකුට ඔහු විසින් මෙම නීතිගත සංස්ථාවට ගෙවිය යුතුව ඇති යම් මුදලක් එක් එක් මාසය අගදී ගෙවීමට ඉතිරිව ඇති මුදල සඳහා ඊට මාසයකට සියයට බාගයක් බැගින් වූ පොලියක් සමග කොටස් වශයෙන් ගෙවීමට පාලක කමිටුවේ අභිමතය පරිදි ලේකම් සහ භාණ්ඩාගාරිකගෙන් අනුමතිය ලබාගත හැකිය.

(4) සාමාජිකයා විසින් නීතිගත සංස්ථාවට ගෙවිය යුතුව ඇති යම් මුදලක්, සාමාජිකයාගේ වැටුප් පතින් අයකර ගැනීමට දුම්රිය සාමාන්‍යාධිකාරිට ද, සාමාජිකයා සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාට සහ භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ට ද බලය තිබිය යුතුය.

**සාමාජිකයකු නැවත ඇතුළත්කර ගැනීම**

12 (1) මෙම අරමුදලේ තම සාමාජිකත්වය අහිමි වූ අවස්ථාවේදී මෙම නීතිගත සංස්ථාවෙන් යම් ප්‍රදානයක් ලබාගෙන නැත්නම් එබඳු සාමාජිකයකුට රජයේ සේවයට නැවත ඇතුළත් කරගැනීමේ දී පාලන කමිටුවේ අනුමැතිය ඇතිව මෙම නීතිගත සංස්ථාවෙහි තම සාමාජිකත්වය නැවත හිමිවිය යුතුය. එබඳු සාමාජිකයකු නැවත පත් කරනු ලැබූ දින සිට සය මසක් ඇතුළතදී ඉල්ලුම්කරු ඔහුගේ සාමාජිකත්වය අහිමි වූ දින සිට ඔහු නීතිගත සංස්ථාවෙහි සාමාජිකයකුව සිටියේ නම් එම නීතිගත සංස්ථාවට ගෙවිය යුතු තම දායක මුදල්, ප්‍රදාන මුදල් හෝ පොලිය එක්වර හෝ කොටස් වශයෙන් මෙම නීතිගත සංස්ථාවට ගෙවිය යුතුය.

(2) එවැනි යම් සාමාජිකයෙකු වෙත යම්කිසි ප්‍රදාන මුදලක් ලැබී ඇත්නම් ප්‍රදානය වශයෙන් ලැබුණු එකී මුදල එක්වර ආපසු ගෙවිය යුතු අතර නීතිගත සංස්ථාවට ගෙවිය යුතු වෙනත් යම් මුදලක් ඇත්නම් මෙම ව්‍යවස්ථාවේ (1) වැනි ඡේදයේ සඳහන් ආකාරයට ගෙවිය යුතුය.

**විශ්‍රාම ගැනීම**

13. (1) සාමාජිකයෙකුගේ විශ්‍රාම ගැනීමේ දී හෝ මරණයේදී ඔහුට බැරව ඇති මුදල් එකී විශ්‍රාම ගැනීම හෝ මරණය, එම සාමාජිකයා සේවය කළ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා හෝ උප දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විසින් දැනුම් දී ඇති දිනයේ සිට තුන්මසක් ඇතුළතදී සාමාජිකයාගෙන් නීතිගත සංස්ථාව වෙත ලැබිය යුතු මුදල් අඩුකරගෙන ඉතිරි මුදල පමණක් ගෙවිය යුතුය.

(2) යම් සාමාජිකයෙකුගේ හදිසි උවමනාවකදී, එම සාමාජිකයා විසින් කෙරෙන ලිඛිත ඉල්ලුම්පතක් මත ප්‍රදාන අරමුදලින් අත්තිකාරම් වශයෙන් රු. 500කට වැඩි නොවන මුදලක් එම සාමාජිකයාට ගෙවීම පාලක කමිටුව විසින් කළ හැකිය.

**මරණය**

14. (1) යම් සාමාජිකයෙකු මරණයට පත්වූ විට එවැනි සාමාජිකයෙකු නමින් බැරව ඇති සියළුම මුදල් සහ ප්‍රදාන මුදල් මියගිය අය සේවය කළ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විසින් එවැනි මරණයක් ගැන දැනුම් දී මාස තුනක් ඇතුළතදී මියගිය අය විසින් නම්කර ඇති තැනැත්තාට හෝ තැනැත්තන්ට ගෙවිය යුතුය.

(2) සාමාජිකයා විසින් යමෙක් නම් කර පත් කර නොමැති නම් හෝ නම් කර ඇති තැනැත්තා මියගොස් සිටී නම් එබඳු සාමාජිකයකුගේ නමට බැරව තිබෙන මුදල් 3 වැනි ඡේදයේ සඳහන් ලියකියවිලි ඉදිරිපත් කරනු ලැබූ විටක භාගයක් භාර්‍යාවට ද භාගයක් නීත්‍යානුකූල දරුවනටද ලැබෙන අනුපාතයට ගෙවිය යුතුය.

(3) භාර්‍යාව සම්බන්ධයෙන් කසාද සහතිකයද, දරුවන් සම්බන්ධයෙන් උප්පැන්න සහතිකයද සමග ප්‍රාදේශීය ආදායම් නිලධාරිගේ අත්සනින් සහතික කරන ලද ග්‍රාමසේවක තැනගේ ලියමනක් පාලක කමිටුව වෙත යැවිය යුතුය.

(4) දරුවන්ගේ වයස අවුරුදු 18ට අඩු නම් එම මුදල්, දරුවන්ගේ නමින් ලංකා සේවින්ස් බැංකුවේ තැන්පත් කිරීමෙන් පසු දරුවන්ගේ නමින් ඇති එම බැංකු පාස්පොත් ඔවුන්ගේ භාරකරුට භාරදිය යුතු ය.

(5) මෙම ව්‍යවස්ථාවේ (1) වැනි (2) වැනි සහ (3) වැනි ඡෙදවල සඳහන් වන ප්‍රකාර ඉල්ලීමක් නොකෙරුනේ නම් සාමාජිකයාගේ මරණය සිදු වූ දින සිට අවුරුදු පහක් ගත වූවාට පසු, එම සාමාජිකයා නමින් ඇති මුදල් සඳහා ඔහුගේ යම් උරුමක්කාරයින්ට හිමිකම් ඉදිරිපත් කළ හැකි වන පරිදි මියගිය සාමාජිකයාගේ උරුමක්කාරයන්ගේ දැනගැනීම පිණිස දැන්වීමක් ප්‍රවෘත්ති පත්‍ර දෙකක පළ කළ යුතු ය.

(6) මියගිය සාමාජිකයාගේ උරුමක්කාරයින්ට පාලක කමිටුවෙන් හිමිකම් ඉල්ලා සිටීමට හැකි අතර, එවැනි ඉල්ලීම් ගැන පාලක කමිටුවේ තීරණය අවසන් මෙන්ම තීරණාත්මක ද විය යුතු ය.

(7) යම්කිසි මුදලක් ගැන හිමිකම් පෑමක් නොමැති විට හෝ පාලක කමිටුව විසින් හිමිකම් ප්‍රතික්ෂෙප කළ විට එවැනි මුදල් මෙම ව්‍යවස්ථාවේ (5) වෙනි ඡෙදයේ සඳහන් ප්‍රකාර නිවේදනයක් පළකර තුන්මසකට පසු අහිමි විය යුතු අතර, එම මුදල මරණාධාර අත්තිකාරම් ගිණුමට පැවරිය යුතු ය.

**මරණාධාර සඳහා අත්තිකාරම්**

15. (1) සාමාජිකයෙක් මියගිය විට මෙම ව්‍යවස්ථාවේ (2) වැනි ඡෙදයේ සඳහන් ප්‍රකාර මරණාධාර අත්තිකාරම් මුදලක් මිය ගිය සාමාජිකයාගේ වැන්දඹුවට, දරුවන්ට, නෑදෑයන්ට හෝ නම් කරනු ලැබූවන්ට, මරණ සහතිකය හෝ සාමාජිකයා සේවය කළ ස්ථානය හෝ කාර්යාලය භාරව සිටි නිලධාරියා විසින් මරණය තහවුරු කරමින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කළ විට ගෙවිය යුතු ය.

(2) 1 වැනි ඡෙදයේ සඳහන් මරණාධාර අත්තිකාරම් මුදල්, මෙහි පහත සඳහන් ප්‍රකාර වැන්දඹුවට, දරුවන්ට, නෑදෑයින්ට හෝ නම්කරනු ලැබූවන්ට නීතිගත සංස්ථාවේ අරමුදලින් ගෙවිය යුතු ය:—

(අ) සාමාජිකත්වය අවුරුදු එකකට වැඩි එහෙත් අවුරුදු පහ නොඉක්මවා ඇතිවිට මරණාධාර සඳහා වූ අත්තිකාරම් මුදල රු. 200 කට වැඩි නොවිය යුතු ය. :—

(ආ) සාමාජිකත්වය අවුරුදු පහකට වැඩි වූ විට මරණාධාර සඳහා අත්තිකාරම් මුදල රු. 500 ට වැඩි නොවිය යුතු ය.

**යැපෙන්නන් සඳහා මරණාධාර අත්තිකාරම්**

16. (1) අවිවාහක සාමාජිකයෙකුගේ දෙමව්පියන්ගෙන් කෙනෙකු මියගිය විට හෝ විවාහක සාමාජිකයෙකුගේ භාර්යාව හෝ වයස අවුරුදු දෙකකට වැඩි එහෙත් අවුරුදු 18 කට අඩු දරුවකු මිය ගිය විට මරණ සහතිකය හෝ මරණය සිදු වූ බව තහවුරු කරමින් කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තුමා සහතික කළ ග්‍රාමසේවක තැනගේ ලියමනක් සමඟ, ලේකම් සහ භාණ්ඩාගාරික වෙත ඉල්ලුම් කළ විටක (2) වැනි ඡෙදයේ සඳහන් ප්‍රකාර මරණාධාර අත්තිකාරම් මුදලක් ගෙවිය යුතු ය.

(2) එබඳු සෑම අවස්ථාවකදී ම සාමාජිකයාගේ සාමාජිකත්වය අවුරුදු එකකට වැඩි එහෙත් අවුරුදු පහ නොඉක්මවා ඇති විට රු. 100 ක් ගෙවිය යුතු අතර සාමාජිකත්වය අවුරුදු පහට වැඩි කල්හි රු. 300 ක් ගෙවිය යුතු ය.

(3) මෙම ව්‍යවස්ථාවේ සඳහන් කළ මරණාධාර අත්තිකාරම් මුදල්, මසකට රු. 5 කට නොඅඩු කොටස් වශයෙන් ආපසු අයකර ගත යුතු ය. මරණාධාර අත්තිකාරම් මුදල් සම්පූර්ණයෙන් ම ආපසු ගෙවන තුරු යම් සාමාජිකයෙකුට කිසිම ආකාරයේ ණය අත්තිකාරම් මුදලක් නොගෙවිය යුතු ය. මුල් මරණාධාර අත්තිකාරම් මුදල සම්පූර්ණයෙන් ආපසු ගෙවීමට ප්‍රථමයෙන් තවත් මරණයක් සිදු වූ විටක එම දෙවැනි අවස්ථාව තෙක් ආපසු අයකර ඇති මුදල් ප්‍රමාණය පමණක් 16(1) වැනි ව්‍යවස්ථාවේ සඳහන් කළ ලියකියවිලි ඉදිරිපත් කළ විට ගෙවිය යුතු ය.

(4) මරණාධාර අත්තිකාරම් මුදල් සඳහා ගෙවිය යුතු පොළිය, ඒ ඒ මාසවල අගදී හිඟව ඇති මුදලට මසකට සියයට භාගය බැගින් විය යුතු ය.

(5) වැරදි තොරතුරු සපයන හෝ අසත්‍ය ප්‍රකාශයක් කරන හෝ වංචනිකලෙස මරණාධාර ලබා ගැනීමේ චේතනාවෙන් පාලන කමිටුව නොමඟ යැවීමට උත්සාහ දරණ සාමාජිකයකු අසුවුන විට එම සාමාජිකයා ගැන විනයානුකූලව ක්‍රියා කරනු ලැබීම සඳහා දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත රිපෝර්තු කළ යුතු අතර නීති ගත සංස්ථාවේ ඔහුගේ සාමාජිකත්වය අත්හිට විය යුතු ය.

(6) මෙම ව්‍යවස්ථා යටතේ යම් මරණාධාර අත්තිකාරම් මුදල් දීමක් ආරම්භ විය යුත්තේ පාලන කමිටුව විසින් මරණාධාර අත්තිකාරම් මුදල් ගෙවීම සඳහා රුපියල් 50,000 ක මුදලක් තැන්පත් කළායින් පසුව ය. මරණාධාර සඳහා අත්තිකාරම් මුදල් දීම ආරම්භ කිරීමට නියම කර ගෙන ඇති දිනට යටත් පිරිසෙයින් දින දහහතරකට වත් කලින් යටත්පිරිසෙයින් මෙරට ප්‍රවෘත්ති පත්‍ර දෙකක වත් දැන්වීමක් ප්‍රසිද්ධ කළ යුතු ය.

(7) මරණාධාර අත්තිකාරම් මුදල් සම්බන්ධයෙන් ආපසු අය කර ගන්නාවූ සියළුම මුදල්, මරණාධාර අත්තිකාරම් ගිණුමට බැර කළ යුතුය. එය වෙනම ශීර්ෂයක් යටතේ පොත්වල ඇතුළත් කළ යුතු ය.

**සිහිවිකලත්වය**

17. (1) යථාපරිදි සංස්ථාපනය කරන ලද වෛද්‍ය මණ්ඩලයක් විසින් සිහිවිකල අය බවට නිගමනය කරන ලද, යම් සාමාජිකයෙකු නමින් නීතිගත සංස්ථාවේ යම් මුදලක් වේ නම්, එම සාමාජිකයා සම්පූර්ණ සුවය ලබා ඇති බවට යථාපරිදි සංස්ථාපනය කරන ලද වෛද්‍ය මණ්ඩලයක් විසින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කරන තුරු එම මුදල නීතිගත සංස්ථාවේ පොත් පත් වල තිබිය යුතු ය. සිහිවිකලත්වයේ සිටියදී ම සාමාජිකයා විශ්‍රාම ගැනීම හෝ මිය යෑම සිදුවුවහොත්, ඔහුගේ නමින් බැරව ඇති මුදල්, ඔහු විසින් නම් කරනු ලැබූවන්ට, උරුමක්කාරයින්ට හෝ නීත්‍යානුකූලව ඔහු වෙනුවෙන් පෙනී සිටින අයෙකුට හෝ අයවලුන්ට මෙහි ඉහතින් දක්වා ඇති ප්‍රකාර ගෙවිය යුතු ය.

(2) එබඳු සාමාජිකයෙකු මිය ගිය විටක ඔහුට වැන්දඹුවක් හෝ දරුවන් නොමැති නම් එම මුදල්, මිය ගිය සාමාජිකයාගේ වෙනත් උරුමක්කාරයින්ට හෝ ඔහු වෙනුවෙන් නීත්‍යානුකූලව පෙනී සිටින අයට ගෙවිය යුතුය.

**පාලක කමිටුව විසින් කරනු ලබන ගෙවීම්**

18. මෙම ව්‍යවස්ථා යටතේ සාමාජිකයෙකු නම් කර ඇති තැනැත්තාට, ඔහුගේ වැන්දඹුවට හෝ උරුමක්කාරයන්ට පාලක කමිටුව විසින් ගෙවන්නට යෙදුන යම් ගෙවීමක් වලංගු විය යුතු අතර වෙනත් තැනැත්තෙකු හෝ තැනැත්තන් විසින් නීතිගත සංස්ථාව වෙත කරනු ලබන ඉල්ලීමකට හෝ වන්දියකට සම්බන්ධ වගකීමෙන් එම නීතිගත සංස්ථාව නිදහස් විය යුතුය.

**ප්‍රදාන මුදල්**

19. (1) අවුරුදු 3කට අධික සාමාජිකත්වයක් ඇති නීතිගත සංස්ථාවේ යම් සාමාජිකයෙකුට, ඔහු විශ්‍රාම ගැනීමේ දී පහත සඳහන් විධිවිධානයන්ට අනුකූලව ප්‍රදාන මුදලක් ගෙවිය යුතුය.

(2) මෙම නීති ගත සංස්ථාවේ අවුරුදු තුනකට අධික සාමාජිකත්වයක් ඇති සාමාජිකයෙකුට ඔහු විශ්‍රාම යෑමේදී නීතිගත සංස්ථාවට අයවිය යුතුව ඇති සියළුම හිඟ මුදල්, අඩු කිරීමෙන් පසුව සාමාජිකයා විසින් ප්‍රදාන මුදල් වශයෙන් ඔහුගේ සාමාජිකත්ව කාල සීමාව තුළදී ගෙවා ඇති ප්‍රමාණය මෙන් දෙගුණයක්, ප්‍රදාන මුදල් වශයෙන් ඔහුට ගෙවිය යුතුය.

(3) අවුරුදු තුනක කාලයක සාමාජිකත්වයක් සම්පූර්ණ කර ඇති සාමාජිකයෙකු මිය යෑමේ දී, එම සාමාජිකයාගෙන් නීතිගත සංස්ථාවට අයවිය යුතුව ඇති සියළුම හිඟ මුදල් අඩුකිරීමෙන් පසුව, මිය ගිය දිනයෙහි දී අවුරුදු 3 ක සාමාජිකත්වයක් සම්පූර්ණ කර ඇති නීතිගත සංස්ථාවේ සියළුම සාමාජිකයන්ගෙන් ඒ එක් එක් සාමාජිකයා වෙනුවෙන් එක් එක් වර්ෂය සඳහා සත 3 බැගින් ගණන් බලා එකී මියගිය සාමාජිකයා නම් කර ඇති තැනැත්තාට ගෙවිය යුතුය. මේ ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා වර්ෂ ගණන් ගැනීමේ දී මාස හයකට වැඩි කාල සීමාවක් සම්පූර්ණ අවුරුද්දක් වශයෙන් ගණන් ගත යුතු අතර, මාස හයකට අඩු කාලයක් වෙත් නම් ගණන් ගනු නොලැබේ.

**ප්‍රදාන මුදල් ආපසු අයකර ගැනීම**

20. ප්‍රදාන මුදල් පළමුකොටම නීතිගත සංස්ථාවේ ඇති මුදල්වලින්ම ගෙවිය යුතු අතර පසුව සාමාජිකයන්ගෙන් විශේෂ ඉල්ලුම් කිරීම් මගින් එක හා සමාන කොටස් වශයෙන් ආපසු අයකර ගත යුතුය. වර්ෂය තුළදී එබඳු ඉල්ලීම් සම්බන්ධයෙන් සාමාජිකයින්ට භර කරනු ලබන මුදල් ඒ ඒ වර්ෂය තුළ හෝ ඊළඟ වර්ෂයේ පළමු හය මාසය ඉකුත් වීමට පෙර සම්පූර්ණයෙන්ම අයකර අවසන් කළ යුතුය.

**ප්‍රදාන මුදල් ආරක්ෂක තැන්පත් මුදල**

ආඥාපනතේ 23 වැනි වගන්තිය අනුව ප්‍රදාන මුදල් ආරක්ෂක තැන්පත් මුදල වෙනුවෙන් රුපියල් 10,00,000 ක මුදලක් තැන්පත් කළ යුතුය.

සාමාජික මුදලින් ණය දීම

22. (1) පාලන කමිටුව විසින් සිය අභිමතය පරිදි යටත් පිරිසෙයින් එක් වර්ෂයක සාමාජිකත්වය සම්පූර්ණ කර ඇති සාමාජිකයෙකු හට ඔහුගේ නමින් නීතිගත සංස්ථාවේ පොත්වල ඇති සාමාජික තැන්පත් මුදලෙන් හතරෙන් තුන් පංගුවකට සමාන මුදලක්, සාමාජිකයාගේ සුභසිද්ධියට හේතුවිය හැකියයි පාලක කමිටුව අදහස් කරන යම් කාර්යයක් සඳහා ණය වශයෙන් යම් සාමාජිකයෙකු වෙත දිය හැකි වේ.

(2) මෙවැනි ණය මුදල් සඳහා වූ ඉල්ලීමක් ඒ කාර්යය සඳහා ඇති ආකෘති පත්‍රයකින් ලේකම් සහ භාණ්ඩාගාරික වෙත ඉදිරිපත් කළ යුතු අතර ණය ඉල්ලා සිටීමේ හේතු සඳහන් ප්‍රකාශයක් ද, සාමාජිකයාගේ පාස්පොත ද ඒ සමඟ එවිය යුතුය.

(3) අයදුම්පතේ අනික් පිටුවේ මුද්‍රණය කර ඇති කුවිතාන්සිය ද සම්පූර්ණ කර ශත දහයේ මුද්දරයක් මත අත්සන යොද, සාක්ෂිකරුවන් දෙදෙනකුගේ අත්සන් ද සහිතව එවිය යුතුය. එබඳු ණය ඉල්ලුම් පත් සඳහා මෙම නීතිගත සංස්ථාවේ චැක්පත් අත්සන් තබන නිලධාරින්ට සාක්ෂිකරුවන් වශයෙන් අත්සන් කිරීමට හිමිකම් නොතිබිය යුතුය.

(4) නිසියාකාරව සම්පූර්ණ කරන ලද, ණය ඉල්ලුම් පතක් සමග, කුවිතාන්සිය ලැබුන විට ඉල්ලුම් කරන ලද ණය මුදල සඳහා චෙක්පතක් ද, හර සහ බැර පිළිබඳ විස්තර අඩංගු පාස්පොත ද, සාමාජිකයා වෙත යැවිය යුතුය.

(5) චෙක්පත සහ පාස්පොත ද ලැබුණ විට සාමාජිකයා විසින් එහි ඇති සටහන් පරීක්ෂාකර වැරදි සහිත යම් සටහන් ඇත්නම් ඒ බැව්, ලේකම් සහ භාණ්ඩාගාරික වෙත වහාම දන්වා, එම වැරදි සටහන නිවැරදි කර ගත යුතුය.

(6) මෙම ව්‍යවස්ථාවේ (1) වැනි ඡෙදය යටතේ යම් සාමාජිකයෙකුට දිය හැකි අඩුම ණය මුදල රු. 20ක් විය යුතුය.

(7) මෙම ව්‍යවස්ථා යටතේ ලේකම් සහ භාණ්ඩාගාරික, සභාපති හා උප සභාපතිවරුන් දෙදෙන විසින් ණය දීම නීත්‍යානුකූල විය යුතුය. ඒ ඒ මාසය තුළ දෙන ලද සියළුම ණය පිළිබඳ විස්තර දක්වෙන උප ලේඛනයක් මාසික ප්‍රකාශයක් ද සමඟ ඒ ඒ මාසය අවසානයේ අනුමැතිය සඳහා පාලක කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය. එම උප ලේඛනයේ සහ මාසික ප්‍රකාශයේ පිටපතක් දුම්රිය සාමාන්‍යාධිකාරී වෙත මාස්පතා යැවිය යුතු ය.

(8) ණය ඉල්ලුම්පතක් ලැබී දින තුනක් ඇතුළත එය ලැබුණ බව දන්වා සිටිය යුතුය. ණය මුදල් සඳහා වූ පොළිය මසකට සියයට භාගයක් විය යුතුය. ණය මුදල් සඳහා පොළිය ගණන් බැලීමේදී මාසයකට අඩු ඕනෑම කාලයක් සම්පූර්ණ මාසයක් වශයෙන් ගණන් ගත යුතුය. ණයක් පියවීම සඳහා මසකට ගෙවිය හැකි අඩුම වාර මුදල රු. 5ක් විය යුතුය.

වැටුප් ණය

23. (1) සාමාජිකත්වය අවුරුදු තුනක් ඉක්ම වූ යම් සාමාජිකයෙකුට කිසියම් හදිසි අවස්ථාවක දී අසනීපයක දී හෝ යම් ආපද කාලයක දී හෝ වෙනයම් සුදුසු හේතුවක් ඇති විටක මෙහි පහත සඳහන් විධි විධානයන්ට අනුකූලව ණයක් දීම පාලක කමිටුව විසින් සිය අභිමතය පරිදි කළ හැකි ය.

(2) වැටුප් ණය වශයෙන් පාලන කමිටුවට එබඳු ණය මුදල් ගෙවිය හැක්කේ සාමාජිකයන්ගේ වැටුප් පත්වලින් මුදල් අඩු කිරීමේ දී සියයට පණහේ සීමාව අනුව හෝ රජයේ සේවකයින්ගේ වැටුප් පත්වලින් මුදල් අයකිරීම පිළිබඳව ගරු මුදල් ඇමතිතුමා විසින් කලින් කල පණවනු ලබන වෙනත් යම් ව්‍යවස්ථාවක් අනුව මෙම නීතිගත සංස්ථාව වෙනුවෙන් ඒ ඒ සාමාජිකයන්ගේ වැටුප් පත් මගින් මුදල් අයකර ගැනීමට හැකි අවස්ථාවල දී පමණක් විය යුතු ය.

(3) මෙම නීතිගත සංස්ථාවේ කාර්යාලයෙන් ලබාගත හැකි වැටුප් ණය අයදුම්පත් නියියාකාරව සම්පූර්ණ කොට, ඒ සඳහා සාක්ෂි දෙකක සහ ඇපකරුවන් දෙදෙනෙකුගේ ද (ඇපකරුවන් අවශ්‍ය වූ විට) අත්සන් සහිතව ලේකම් සහ භාණ්ඩාගාරික වෙත ඉදිරිපත් කළ යුතුය.

(4) සාමාජිකයෙකුට තමා හඳුනන වෙනත් යම් සාමාජිකයෙකුගේ ණය ඉල්ලුම් පතක් සඳහා සාක්ෂි වශයෙන් අත්සන් කළ හැකි ය. එහෙත් ඇපකරු වශයෙන් අත්සන් කරන සාමාජිකයන්ට එසේ ඇපකරුවන් වශයෙන් අත්සන් කිරීමට හැකිවන්නේ සාමාජිකයන් දෙදෙනෙකු සඳහා පමණක් මිස ඊට වැඩි ගණනක් සඳහා නොවේ.

(5) මාස හයක වැටුප් ණයක් ලැබීමට සුදුසු අයදුම්කරුවන් සඳහා ඇපකරුවන් වශයෙන් පිළිගනු ලැබීමේ හිමිකම් අවුරුදු දහයක සාමාජිකත්වය ඉක්මවූ සාමාජිකයන්ට පමණක් තිබිය යුතුය.

(6) මාස නවයක වැටුප් ණයක් ලැබීමට සුදුසු අයදුම්කරුවන් සඳහා ඇපකරුවන් වශයෙන් පිළිගනු ලැබීමේ හිමිකම් අවුරුදු පහළොවක සාමාජිකත්වයක් ඉක්මවූ සාමාජිකයන්ට පමණක් තිබිය යුතු ය.

(7) වර්ෂ එකක වැටුප් අත්තිකාරමක් ලැබීමට සුදුසු අයදුම්කරුවන් සඳහා ඇපකරුවන් වශයෙන් පිළිගනු ලැබීමේ හිමිකම අවුරුදු විස්සක සාමාජිකත්වයක් ඉක්මවූ සාමාජිකයන්ට පමණක් තිබිය යුතු ය.

(8) නිසියාකාරව සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත් ලේකම් සහ භාණ්ඩාගාරික විසින් අංක පිළිවෙලින් ඒ කාර්යය සඳහා තිබෙන සටහන් පොතේ ඇතුළත් කර සෑම මාසයකම අවසානයේ දී පාලක කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය. පාලක කමිටුව විසින් හෝ ඒ සඳහා බලතල පවරන ලද නිලධාරීන් විසින් හෝ අනුමත කරනු ලබන පරිදි ණය අල්ලුම්කරුවන් වෙත ණය මුදල් ගෙවිය යුතු ය.

(9) සියළුම වැටුප් ණය මුදල් අත්තිකාරම් පහත සඳහන් විධිවිධානවලට යටත්ව ගෙවිය යුතු ය:—

(අ) සාමාජිකත්වය අවුරුදු තුනක් ඉක්මවා ඇති, එහෙත් අවුරුදු පහක් ඉක්මවා නැති සාමාජිකයන් සඳහා වැටුප් ණය අත්තිකාරම් මුදල, මාසයක මූලික වේතනය නොඉක්මවන ප්‍රමාණය හෝ රුපියල් 200 යන දෙකෙන් වැඩි ප්‍රමාණය විය යුතු ය.

(ආ) සාමාජිකත්වය අවුරුදු පහක් ඉක්මවා ඇති, එහෙත් අවුරුදු දහයක් ඉක්මවා නැති සාමාජිකයින් සඳහා වැටුප් ණය අත්තිකාරම් මුදල, මාස තුනක මූලික වේතනය නොඉක්ම වූ ප්‍රමාණය හෝ රු. 500 යන දෙකෙන් වැඩි ප්‍රමාණය විය යුතු ය.

(ඇ) සාමාජිකත්වය අවුරුදු දහයක් ඉක්මවා ඇති එහෙත් අවුරුදු පහළොවක් ඉක්මවා නැති සාමාජිකයින් සඳහා වැටුප් ණය අත්තිකාරම් මුදල මාස හයක වැටුප නොඉක්මවූ ප්‍රමාණය හෝ රු. 1,000 යන දෙකෙන් වැඩි ප්‍රමාණය විය යුතු ය.

(ඈ) සාමාජිකත්වය අවුරුදු පහළොවක් ඉක්මවා ඇති එහෙත් අවුරුදු විස්සක් ඉක්මවා නැති සාමාජිකයන් සඳහා වැටුප් ණය අත්තිකාරම් මුදල, මාස නවයක මූලික වැටුප නොඉක්මවූ ප්‍රමාණය හෝ රු. 1,500 යන දෙකෙන් වැඩි ප්‍රමාණය විය යුතු ය.

(ඉ) සාමාජිකත්වය අවුරුදු විස්ස ඉක්ම වූ සාමාජිකයින්ට වැටුප් ණය අත්තිකාරම් මුදල වර්ෂයක මූලික වැටුප නො ඉක්මවූ ප්‍රමාණය හෝ රු. 2,000 යන දෙකෙන් වැඩි ප්‍රමාණය විය යුතු ය.

(10) මෙම ව්‍යවස්ථා මාලාවට යටත්ව ගෙවිය හැකි උපරිම ණය මුදල රු. 2,000කට නොවැඩි විය යුතුය. දැනටමත් ලබා ගෙන ඇති ණය මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කිරීමට ප්‍රථම කිසිම සාමාජිකයෙකුට මෙම ව්‍යවස්ථා මාලාව යටතේ වෙනත් දෙවන ණය මුදලක් ලබා ගැනීමට අයිතිවාසිකමක් නොතිබිය යුතුය. ලබාගත් ණය මුදල සම්පූර්ණයෙන්ම අයකර ගැනීමට ප්‍රථම කිසිම සාමාජිකයෙකුට වැටුප් ණය කොටස් මුදල අඩුකිරීමට හෝ කොටස් මුදල් ගෙවීම ප්‍රතික්ෂේප කිරීමට හෝ නොහැකි විය යුතුය.

(11) වැටුප් ණය අත්තිකාරම් මුදල සඳහා නිසියාකාරව සම්පූර්ණ කරන් ලද රිසිට්පත, ලේකම් සහ භාණ්ඩාගාරික වෙත පාස්පොත ද සමඟ ඉදිරිපත් කළ යුතුය. ලැබුණු බව ඇඟවීමේ පත ලැබී දින තුනක් ඇතුළත මෙම ණය මුදලේ ප්‍රමාණයට චැක්පතක් සමඟ පාස්පොත ද සාමාජිකයා වෙත යැවිය යුතුය.

(12) මෙසේ ලබාගන් ා ලද වැටුප් ණය මුදල් සඳහා ගෙවිය යුතු පොළිය ඒ ඒ මාසයේ අවසානයේ ඉතිරිව ඇති ණය මුදලට මාසයකට සියයට භාගයක් බැගින් විය යුතු ය.

**වැටුප් ණය මුදල් අයකර ගැනීම**

24. (1) මෙම ව්‍යවස්ථා මාලාවේ 23 වැනි ව්‍යවස්ථාව යටතේ ගෙවන ලද වැටුප් ණය මුදල් පොළිය ද සමඟ කොටස් වශයෙන් මෙහි පහත සඳහන් දන්දමට නීතිප්‍රකාර අයකර ගත යුතු ය :—

(අ) ණය මුදල මාසික මූලික වැටුපට හෝ නියම කර ඇති උපරිම ප්‍රමාණයට වැඩි නොවන විට සම්පූර්ණ ණය මුදල සමාන මාසික කොටස් 18කින් ගෙවිය යුතු ය.

(ආ) ණය මුදල මාස තුනක මූලික වැටුපට හෝ නියම කර ඇති උපරිම ප්‍රමාණයට වැඩි නොවන විට සම්පූර්ණ ණය මුදල සමාන මාසික කොටස් 24කින් ගෙවිය යුතු ය.

(ඇ) ණය මුදල මාස හයක මූලික වැටුපට හෝ නියම කර ඇති උපරිම ප්‍රමාණයට වැඩි නොවන විට සම්පූර්ණ ණය මුදල සමාන කොටස් 36කින් ගෙවිය යුතු ය.

(ඈ) ණය මුදල මාස නවයක මූලික වැටුපට හෝ නියම කර ඇති උපරිම ප්‍රමාණයට වැඩි නොවන විට සම්පූර්ණ ණය මුදල සමාන මාසික කොටස් 48කින් ගෙවිය යුතු ය.

(ඉ) ණය මුදල එක් වර්ෂයක මූලික වැටුපට හෝ නියම කර ඇති උපරිම ප්‍රමාණයට වැඩි නොවන විට සම්පූර්ණ ණය මුදල සමාන මාසික කොටස් 60කින් ගෙවිය යුතු ය.

(2) යම් සාමාජිකයෙකු 23 වැනි ව්‍යවස්ථාව යටතේ ලබාගත් යම් ණය මුදලක් ආපසු නොගෙවන විට, ගෙවීමට ප්‍රතික්ෂේප කරන විට හෝ ගෙවීම පැහැර හරින විට, ණය මුදල ගෙවනු ලැබූ සාමාජිකයාගේ නමින් නීතිගත සංස්ථාවේ පොත්වල ඇති යම් මුදලකින් එම ණය මුදල එක්වර හෝ කොටස් වශයෙන් සම්පූර්ණයෙන්ම අයකර ගත යුතුය. එසේම පාලක කමිටුව සුදුසු යැයි සිතන ආකාරයකට ඇපකරුවන්ගෙන් එම මුදල ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට ද පාලක කමිටුවට හිමිකම් තිබිය යුතු ය. මුළු ණය මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන තුරු හෝ අයකර ගන්නා තුරු ඇපකරුවන්ට මෙම නීතිගත සංස්ථාවෙන් වෙනත් යම් ණය මුදලක් ලබා ගැනීමට හිමිකම් නොතිබිය යුතු ය.

**හිඟ මුදල්**

25. දුම්රිය දෙපාර්තමේන්තුවෙන් හෝ වෙනත් රජයේ දෙපාර්තමේන්තුවකින් යම් සාමාජිකයෙකු සේවයෙන් පහකරනු ලැබුවහොත් එම සාමාජිකයාගෙන් මෙම නීතිගත සංස්ථාවට අයවිය යුතු මුදල නීති මඟින් අයකර ගත යුතු ය.

**සුළු මුදල්**

26. සුළු වියදම් අවශ්‍යතාවයන් පිරිමැසීම සඳහා ලේකම් සහ භාණ්ඩාගාරිකට අරමුදලට අයිති මුදලින් රුපියල් එකසිය පණහකට වැඩි නොවන මුදලක් තමන් ළඟ තබා ගැනීමට හැකිය.

**ලාභාංශ**

27. 21 වැනි වගන්තියේ සඳහන් පරිදි මුදල් වර්ෂය අවසානයේ ශේෂ පත්‍රය මඟින් පෙන්නුම් කරන ලාභ මුදල්, රුපියල් දස ලක්ෂය වන තුරු ප්‍රදාන ආරක්ෂක අරමුදලට එකතු කළ යුතු ය. ඉන් පසුව ලැබෙන නීතිගත සංස්ථාවේ ලාභ මුදල්, නීතිගත සංස්ථාවේ පොත්පත්වල සාමාජිකයින් නමින් තැන්පත්ව ඇති මුදල් ප්‍රමාණයන්ගේ අනුපාතයට ගැළපෙන අයුරින් සාමාජිකයින්ට ලාභාංශ වශයෙන් බෙදිය යුතු ය. සාමාජිකයෙකු වෙත ලැබෙන එබඳු ලාභාංශ සාමාජිකයා වෙනුවෙන් නීතිගත සංස්ථාවේ ඇති පොත්වල ගිණුමට බාර කළ යුතු ය.

**විශේෂ මහ සභා රැස්වීම්**

28. සභාපති විසින් ලිඛිත ඉල්ලීමක් කළ විටක ලේකම් සහ භාණ්ඩාගාරික විසින් නීතිගත සංස්ථාවේ සාමාජිකයින්ගේ මහ සභාවක් කැඳවිය යුතු ය. එවැනි මහ සභාවක් කැඳවන දිනට යටත් පිරිසෙයින් දින හතකට කලින් එම රැස්වීම පැවැත්වෙන දිනය, වේලාව හා රැස්වීම කැඳවීමට තුඩුදුන් හේතුව සඳහන් නිවේදනයක්, අඩු වශයෙන් ස්වදේශීය පුවත් පත් දෙකක පළකිරීමෙන් හා සෑම සාමාජිකයෙකු වෙතම ලියා දන්වීමෙන් සියළු සාමාජිකයින් වෙත එම රැස්වීම ගැන දනුම් දිය යුතු ය. එබඳු යම් මහ සභාවකදී දන්වීමෙහි නිශ්චිතව සඳහන් කර්තව්‍යයට පිටස්තර කිසිදු මාතෘකාවක් සාකච්ඡාවට භාජනය නො කළ යුතු ය.

(2) සාමාජික සංඛ්‍යාවෙන් 50 දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවකගේ ලිඛිත ඉල්ලීමක් අනුව, ආඥාපනතේ 17 වන වගන්තියේ විධිවිධානයන්ට අනුකූලව නීතිගත සංස්ථාවේ සාමාජිකයින්ගේ මහ සභා රැස්වීමක් ලේකම් සහ භාණ්ඩාගාරික විසින් කැඳවිය යුතු අතර එබඳු රැස්වීමක් පාලක කමිටුවේ නියෝගය පරිදි කැඳවිය යුතු ය.

(3) පාලක කමිටුවේ සභා රැස්වීමක දී වැඩි ඡන්ද සංඛ්‍යාවකින් අනුමත වූ යෝජනාවක් මත හෝ පාලක කමිටුවේ යටත් පිරිසෙයින් සාමාජිකයින් හත් දෙනෙක් විසින් කරන ලද ලිඛිත ඉල්ලීමක් මත හෝ සාමාජිකයින් පණහකට නොඅඩු සංඛ්‍යාවක් විසින් කරන ලද ලිඛිත ඉල්ලීමක් මත ලේකම් සහ භාණ්ඩාගාරික විසින් සාමාජිකයින්ගේ විශේෂ මහ සභා රැස්වීමක් කැඳවිය යුතුය.

(4) චක්‍ර ලේඛනයක් නිකුත් කිරීමෙන් සහ ප්‍රවෘත්ති පත්‍රවල දන්වීමක් පළ කිරීමෙන් ලේකම් සහ භාණ්ඩාගාරික විසින් න්‍යාය පත්‍රයේ අන්තර්ගත කර්තව්‍යයන් සාමාජිකයින් වෙත දන්වා සිටිය යුතු ය. එබඳු දන්වීමක සඳහන් නියමිත කර්තව්‍යයට පිටස්තර කිසිදු දයක් එවැනි රැස්වීමක දී ඉදිරිපත් කිරීමක් හෝ සැලකිල්ලට භාජනය කිරීමක් නොකළ යුතු ය.

**වාර්ෂික මහ සභා රැස්වීම**

29. (1) සෑම වර්ෂයකම මාර්තු 31ට පෙර යම් දිනයක, නීතිගත සංස්ථාවේ සාමාජිකයින්ගේ වාර්ෂික මහ සභා රැස්වීම කොළඹ දී පැවැත්විය යුතුය.

(2) එවැනි වාර්ෂික මහ සභා රැස්වීම පිළිබඳ දන්වීම රැස්වීම පැවැත්වීමට නියම කර ඇති දිනට යටත් පිරිසෙයින් දින හතකටවත් කලින් සියළුම සාමාජිකයින් වෙත යැවිය යුතු ය. තවද එම දන්වීම යටත් පිරිසෙයින් ප්‍රවෘත්ති පත්‍ර දෙකක ද පලකළ යුතු අතර චක්‍රලේඛයක් මඟින් සාමාජිකයින් වෙත ද දන්වා සිටිය යුතු ය.

(3) වාර්ෂික මහ සභා රැස්වීමකදී යම් සාමාජිකයෙක් යම් යෝජනාවක් ඉදිරිපත් කිරීමට කැමැත්තෙහි නම් එම යෝජනාව ලේකම් සහ භාණ්ඩාගාරික වෙත රැස්වීම පැවැත්වීමට නියම කර ඇති දිනට අඩු වශයෙන් දින හතකට ප්‍රථම ලියා දන්විය යුතුය.

**ගණපූරණය**

30. මෙම නීතිගත සංස්ථාවේ යම් මහ සභා රැස්වීමකදී ගණපූරණය සාමාජිකයින් එකසිය පණස් දෙනෙකුට අඩු නොවිය යුතුය.

**නිලධාරින් පත්කර ගැනීම**

31. (1) සෑම අවුරුද්දකම වාර්ෂික මහා සභා රැස්වීමේ දී නීතිගත සංස්ථාවේ සාමාජිකයින් අතුරෙන් සභාපති, උප සභාපතිවරුන් දෙදෙනෙකු හා පාලක කමිටුව සඳහා කාරක සභිකවරුන් දොළොස් දෙනෙකු යන තනතුරු සඳහා ඡන්ද විමසීමක් මඟින් නිලධාරින් තෝරා පත්කර ගත යුතුය. නිලධාරින්ගේ තනතුරු සහ පාලක කමිටුවේ කාරක සභිකවරුන් දොළොස් දෙනෙකු ඡන්ද විමසීමක් මඟින් තෝරා ගැනීම සඳහා සාමාජිකයින් අතුරෙන් නාම යෝජනා පත්‍ර කැඳවිය යුතුය. එබඳු සෑම නාම යෝජනා පත්‍රයක් රැස්වීම පැවැත්වීමට නියම කර ඇති දිනට අඩු වශයෙන් සති හයකට ප්‍රථමයෙන්වත් ලේකම් සහ භාණ්ඩාගාරික වෙත ලැබිය යුතුය.

(2) එසේ ලැබුන නාම යෝජනා පත්‍ර 32 වැනි ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට අනුකූල බවට පාලක කමිටුව විසින් වගබලා ගත යුතු අතර නාම යෝජනා කර ඇති අපේක්ෂකයින්ගේ නම් ලැයිස්තුවක් පිළියෙල කර, එය අඩු වශයෙන් රැස්වීම පැවැත්වීමට නියම කර ඇති දිනට සති දෙකකට ප්‍රථමයෙන්වත් සාමාජිකයින් අතර බෙද හැරිය යුතු ය.

(3) සභාපති, උප සභාපතිවරුන් දෙදෙනෙකු සහ පාලක කමිටුවේ සාමාජිකයින් දෙළොස් දෙනා රහස් ඡන්දයක් මඟින් පත්කර ගත යුතු ය. එසේ තෝරා ගනු ලැබූ නිලධාරින් සහ පාලක කමිටුවේ සාමාජිකයින් ඊළඟ සංවත්සර මහ සභා රැස්වීම පැවැත්වෙන තුරු තම නිලයන් දැරිය යුතු ය.

(4) ලේකම් සහ භාණ්ඩාගාරික විසින් මහ සභා රැස්වීමට පැමිණ සිටින සාමාජිකයින් අතරේ බෙද දෙනු ලබන ඡන්ද පත්‍රිකාවෙහි අපේක්ෂකයාගේ නමට ඉදිරියෙන් මුද්‍රණය කර ඇති කොටු තීරය ඇතුළත " × " ලකුණ යෙදීමෙන් සාමාජිකයින් විසින් ඡන්දය පාවිච්චි කර එම ඡන්ද පත්‍රිකාව ලේකම් සහ භාණ්ඩාගාරිකට හෝ මහ සභා රැස්වීමෙහි ඡන්ද පත්‍රිකා භාර ගැනීමට පත්කරන ලද නිලධාරියා වෙත හෝ නිලධාරින් වෙත ආපසු භාරදිය යුතු ය.

(5) සභාපති, උපසභාපතිවරුන් දෙදෙනෙකු සහ පාලක කමිටුවේ කාරක සභිකවරුන් දොළොස් දෙනෙකු තෝරා පත්කර ගැනීම සඳහා සෑම සාමාජිකයෙකුටම ඡන්ද පහළොවකට (15) හිමිකම් තිබිය යුතුය. මෙම ව්‍යවස්ථාවලට පටහැනි වන ඡන්ද පත්‍රිකා ප්‍රතික්ෂේප විය යුතු ය.

**අයදුම්කරුවන්ගේ සුදුසුකම්**

32. (1) සභාපති, උප සභාපති යන තනතුරුවලට තරග කරන යම් අයදුම්කරුවකුට මෙම නීතිගත සංස්ථාවේ අවුරුදු විස්ස කට වැඩි කාලයක සාමාජිකත්වයක් තිබිය යුතු අතර රාජ්‍ය භාෂාවෙන් වැඩ කිරීමට ප්‍රවීණත්වයක් සහ ඉංග්‍රීසි පිළිබඳ මනා දැනුමක් ද තිබිය යුතු ය.

(2) පාලක කමිටුවේ කාරක සභික ධුර සඳහා තරග කරන යම් සාමාජිකයකුට නීති ගත සංස්ථාවේ අවුරුදු දහයකට වැඩි සාමාජිකත්වයක් තිබිය යුතු අතර නීතිගත සංස්ථාවේ වැඩ කටයුතු රාජ්‍ය භාෂාවෙන් කිරීමට ප්‍රවීණත්වයක් තිබිය යුතු ය.

(3) වර්ෂ දෙකක් පිට පිටම එබඳු නිලධාරී තනතුරක් දැරූ යම් නිලධාරියකු හෝ පාලන කමිටුවේ කාරක සභිකයකු තෙවන වර්ෂයේ එවැනි කිසිදු තනතුරක් සඳහා මහ සභා රැස්වීමක දී තරග කිරීමට සුදුසුස්සකු නොවිය යුතු ය.

**ලේකම් සහ භාණ්ඩාගාරික ගේ රාජකාරි**

33. (1) ආඥපනතේ 6 වන වගන්තියේ විධිවිධානයන්ට යටත්ව ලේකම් සහ භාණ්ඩාගාරික ධුරයට තෝරාපත්කර ගන්නා ලද සාමාජිකයා ආඥපනතේ හත්වන (7) වගන්තියට අනුකූලව තම රාජකාරි ඉටුකළ යුතු අතර, තමන් විසින් නීතිගත සංස්ථාවට යම් අලාභයක් හෝ හානියක් කරනු ලැබුවහොත් ඔහු ඒ සඳහා වගකිව යුතු අතර, එම අලාභයට හෝ හානියට ඔහුගෙන් අලාභය අයකර ගැනීමට නීතිගත සංස්ථාවට බලය තිබිය යුතුය.

(2) කාර්ය මණ්ඩලයේ යම් නිලධාරියකු හෝ යම් සාමාජිකයකු යම් අක්‍රමිකතාවයක් හෝ වංචාවක් සිදුකරනු ලැබූ විට, ඒ බැව් පාලක කමිටුව වෙත ලේකම් සහ භාණ්ඩාගාරික විසින් වාර්තා කළ යුතු ය.

(3) නොසැලකිල්ල නිසා ලේකම් සහ භාණ්ඩාගාරික විසින් නීතිගත සංස්ථාවට යම් අලාභයක් සිදු කරනු ලැබූ විට එය එම ලේකම් සහ භාණ්ඩාගාරිකගෙන් අයකර ගත යුතු ය.

(4) පාලක කමිටුව විසින් හෝ යම් නිලධාරියෙකු විසින් ව්‍යවස්ථා කිසිවකට පටහැනිව ක්‍රියා නොකළ යුතු අතර පාලක කමිටුවේ යම් කාරක සභිකයෙකුගෙන් හෝ නිලධාරියෙකුගෙන් නීතිගත සංස්ථාවට යම් අලාභ හානියක් සිදු වූ කල එම කාරක සභිකයාගෙන් හෝ නිලධා යාගෙන් එම සියළුම අලාභය අයකර ගැනීමට නීතිගත සංස්ථාවට හිමිකම් තිබිය යුතු ය.

**පාලක කමිටුවේ රාජකාරි**

34. ආඥපනත් විධිවිධානයන්ට හා මෙම ව්‍යවස්ථාවලට අනුකූලව පාලන කමිටුව තම රාජකාරි ඉටු කළ යුතු ය.

**පාස්පොත ණය ගණුදෙනු සටහන් පත්‍රිකාව සහ ව්‍යවස්ථා පොත**

35. (1) සෑම සාමාජිකයකුටම සාමාජිකත්වය ලැබුන අවස්ථාවේම ආඥපනතේ පිටපතක් ද මෙම ව්‍යවස්ථා මාලාවේ පිටපතක් හා පාස් පොතක් ද නිකුත් කළ යුතු ය.

(2) තම තමන්ගේ ගිණුම් සටහන් කරවා ගැනීම සඳහා සියළුම සාමාජිකයින් තම පාස්පොත් වර්ෂයකට දෙවරක් ගණන් පරීක්ෂණයට ප්‍රථම හා පසුව නීතිගත සංස්ථාවේ කාර්යාලයය වෙත එවිය යුතුය. වාර්ෂික ගණන් පරීක්ෂණයට ප්‍රථම හා පසුව තම තමන්ගේ පුද්ගලික ගිණුම් පිළිබඳ සහතික කරන ලද ප්‍රකාශයක් සියළුම සාමාජිකයින්ට සැපයිය යුතු ය.

**නීතිගත සංස්ථාව සතු දේපල**

36. නීතිගත සංස්ථාවට අයිති සියළුම පොත්පත්, ලිපිද්‍රව්‍ය, ලිපිගොනු, ගෘහ භාණ්ඩ සවි කිරීම් සහ එවැනි දේපලවල සුරක්ෂිත භාවය පිළිබඳව ලේකම් සහ භාණ්ඩාගාරික වගකිව යුතු ය.

**සේවා ස්ථානය සහ ලිපිනයන් වෙනස්වීම්**

37. සියළුම සාමාජිකයින් තම සේවා ස්ථාන හා ලිපිනයන් වෙනස්වීම් පිළිබඳ ලේකම් සහ භාණ්ඩාගාරිකට දැනුම් දිය යුතුය.

**මුදල් වර්ෂය**

38. මෙම නීතිගත සංස්ථාවේ මුදල් වර්ෂය සෑම වසරකම නොවැම්බර් මස පළමුවන දින පටන් ගෙන ඊළඟ අවුරුද්දේ ඔක්තෝබර් 31 වැනිදයින් අවසන් විය යුතු ය.

**පැමිණිලි හා පරීක්ෂණ**

39. මෙම නීතිගත සංස්ථාවේ යම් සාමාජිකයෙකු විසින් නීතිගත සංස්ථාවට අදාළ යම් කරුණක් සම්බන්ධයෙන් යම් පැමිණිල්ලක් කළ විට දුම්රිය සාමාන්‍යාධිකාරීට හෝ භාණ්ඩාගාරයේ ලේකම්ට හෝ භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ට ඒ ගැන පරීක්ෂණයක් පැවැත්වීමට බලය තිබිය යුතු ය.

**පැරණි ව්‍යවස්ථා අවලංගු කිරීම**

40. නීතිගත සංස්ථාව විසින් මීට ඉහතින් පණවනු ලැබූ සියළුම පැරණි ව්‍යවස්ථා මෙයින් අවලංගු කෙරෙන අතර මෙම ව්‍යවස්ථා ඒ සියළුම ව්‍යවස්ථා අභිබවා සිටිය යුතු ය.

10–795

---

## නොතාරිස් ආඥපනත (107 වන අධිකාරය)

මාතර අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි සහ සිංහල භාෂාවන් ගෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් පද්මා සමන්මලී රාමචන්ද්‍ර මහත්මිය විසින් නොතාරිස්වරුන් පිළිබඳ (පරිච්ඡේද අංක 107 දරණ) ආඥපනතේ 22 (1) දරණ වගන්තිය යටතේ 1970ක් වූ අගෝස්තු මස 18 වැනි දින සිට නොතාරිස් ධුරයෙන් ඉල්ලා අස්වීමේ ලියකියවිලි ඉදිරිපත් කරන ලදුව, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් එකී දින සිට, එම ඉල්ලා අස්වීම භාරගෙන තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970ක් වූ සැප්තැම්බර් මස 28 වැනි දින,
කොළඹ දීය.

10-710

---

## (219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනත

### කොළඹ රෝහල් මණ්ඩලයේ ආරෝග්‍යශාලා කාරක සභාව

(219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනතෙහි 11 වෙනි වගන්තිය යටතේ 1970 දෙසැම්බර් මස 31 වෙනි දායින් අවසන් වන කාලසීමාවට මර්වින් සී. පෙරේරා මහතා කොළඹ රෝහල් මණ්ඩලයේ ආරෝග්‍යශාලා කාරක සභාවේ සාමාජිකයෙක් වශයෙන් ගරු සෞඛ්‍ය ඇමතිතුමා විසින් පත් කරනු ලැබූහ.

සී. ඊ. එස්. වීරතුංග,
ස්ථිර ලේකම්.

1970 ඔක්තෝබර් මස 10 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ දීය.

10-715

---

## (219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනත

### දකුණු කොළඹ ආරෝග්‍යශාලා කාරක සභාව

(219 වෙනි අධිකාරය වන) සෞඛ්‍ය සේවා පනතෙහි 11 වෙනි වගන්තිය යටතේ 1970 දෙසැම්බර් මස 31 වෙනි දායින් අවසන් වන කාලසීමාවට ඒ. සී. ධර්මදාස මහතා දකුණු කොළඹ ආරෝග්‍ය ශාලා කාරක සභාවේ සාමාජිකයෙක් වශයෙන් ගරු සෞඛ්‍ය ඇමති තුමා විසින් පත් කරනු ලැබූහ.

සී. ඊ. එස්. වීරතුංග,
ස්ථිර ලේකම්.

1970 ඔක්තෝබර් මස 10 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ දීය.

10-716

## තැපැල් කාර්යාලයීය ආඥපනත

(190 අධිකාරය වන) තැපැල් කාර්යාලයීය ආඥපනතේ 16 වන වගන්තිය යටතේ තැපැල් සහ විදුලි සංදේශ ඇමතිවරයා විසින් පනවන ලද ව්‍යවස්ථාව.

සී. කුමාරසූරියර්,
තැපැල් සහ විදුලි සංදේශ ඇමති.

1970 ඔක්තෝබර් 15 දින,
කොළඹ දීය.

### ව්‍යවස්ථාව

(190 අධිකාරය වන) තැපැල් කාර්යාලයීය ආඥපනතේ 16 වන වගන්තිය යටතේ පනවා, අංක 14,707 සහ 1966 අගෝස්තු 5 දින දරන ගැසට් පත්‍රයේ පළකරනු ලැබ, අංක 14,925 සහ 1970 සැප්තැම්බර් 25 දින දරන ගැසට් පත්‍රයේ පළකරන ලද ව්‍යවස්ථාවෙන් අන්තිම වරට සංශෝධිත ව්‍යවස්ථාව, ඊට යාකොට ඇති උපලේඛනයෙහි 83 වන විෂයයට ඉක්බිතිවම පහත සඳහන් අලුත් විෂයය ඇතුළත් කිරීමෙන් මෙයින් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ :—

"84. එක්සත් ජාතීන්ගේ ලාංඡනය සහ සාමය නිරූපනය කරන පරෙවියන් සහ ප්‍රගතිය විදහා දක්වන වැඩිවන දිගින් යුතු ඉටි රූසක් පිළිබිඹු කැරෙන රුපියල් දෙකේ වටිනාකමෙන් යුත් තැපැල් සහ ආදායම් මුද්දර."

10-814

---

## සමගි මණ්ඩල පනත

### ආඥාව

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 (1), 3 (8) හා 4 (1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, රත්නසිරි වික්‍රමනායක වන මම—

(අ) 1968 සැප්තැම්බර් 27 වන දින අංක 14,821 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3 (2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උපලේඛනයෙහි අංක 2 දරණ ස්ථානයෙහි විස්තර කරනු ලැබූ මැද පළාත ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහතසඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි.

(1) පෙරිපැහැ, අංකෙළිය, "සඳසිරි" හි පදිංචි තුන්පැලේ අංකෙළියේ නිශ්ශංක මුදියන්සේලාගේ කිරි බණ්ඩා නිශ්ශංක මහතා.

(2) උඩමාදුර, බූටාව පදිංචි දිසානායක මුදියන්සේලාගේ බදුල්ලේ ගෙදර කිරිබණ්ඩා මහතා.

(3) උඩමාදුර, අලකොළඇල්ල, එගොඩගම පදිංචි ගලගෙදර මුතුකුඩේ වික්‍රමසිංහ මුදියන්සේලාගේ පොඩිඅප්පුහාමි මහතා.

(4) කළුගන්වත්ත, අමුණුගේන පදිංචි යාපාමුදියන්සේලාගේ අප්පුහාමි මහතා.

(5) කළුගන්වත්ත, ගල්කැටිවෙල, වැලහිඳ පදිංචි අත්තනායක මුදියන්සේලාගේ අප්පුහාමි මහතා.

(6) කළුගන්වත්ත, ගල්කැටිවෙල පදිංචි කලගහගෙදර කුමාරසිංහ මුදියන්සේලාගේ හින්නි අප්පුහාමි මහතා.

(7) කළුගන්වත්ත, ගල්කැටිවෙල පදිංචි මාන්න උතුම් ජයසේකර මුදියන්සේලාගේ පුංචිබණ්ඩා මහතා.

(8) කළුගන්වත්ත, ගල්කැටිවෙල, ගොම්මන පදිංචි අත්තනායක මුදියන්සේලාගේ කරුණාරත්න මහතා.

(9) කළුගන්වත්ත, ගල්කැටිවෙල, හපුගහපිටිය පදිංචි වීරසිංහ මුදියන්සේලාගේ වන්නකුරාළ මහතා.

(10) අරුක්වත්ත, දඹේගාවතැන්න පදිංචි ලුණුවත්තේ ගෙදර පුංචිඅප්පුහාමි රත්නායක මහතා.

(11) තෙරිපැහැ, ගාල්පිටිය පදිංචි ගුණවර්ධන ලියනගේ හින්නි අප්පුහා මිමහතා.

(12) තෙරිපැහැ, "මානෙල්" හි පදිංචි සෝමතිලක සුරසේන කුරේ මහතා.

(13) තෙරිපැහැ, "චිත්‍රා" හි පදිංචි කෝනාකාර මුදියන්සේලාගේ පුංචිබණ්ඩා අගලකුඹුර මහතා.

(14) තෙරිපැහැ, මෝරංගහතැන්න පාසැලෙහි සමරකෝන් මුදියන්සේලාගේ සෙනෙවිරත්න මහතා.

(15) හල්ගුන්ඔය, අරුක්වත්ත, තැපැල් කායසීංලයෙහි ලුණුවත්තේගෙදර සිංගිරි බණ්ඩා රත්නායක මහතා.

(16) හල්ගුන්ඔය, අරුක්වත්ත පදිංචි බණ්ඩා නිශ්ශංක මහතා.

(17) තෙරිපැහැ, "පියසෙවන" හි පදිංචි නිශ්ශංක මුදියන්සේලාගේ තුන්පැලේ ගෙදර පියදාස නිශ්ශංක මහතා.

(ආ) තෙරිපැහැ, අංකෙළිය, "සඳසිරි" හි පදිංචි තුන්පැලේ අංකෙලියේ නිශ්ශංක මුදියන්සේලාගේ කිරි බණ්ඩා නිශ්ශංක මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

ආර්. වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 ඔක්තෝබර් මස 11 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

10-739

---

## සමගි මණ්ඩල පනත

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමඟ කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 2 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින්, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, රත්නසිරි වික්‍රමනායක වන මම, මීට යා කොට ඇති උපලේඛනයෙහි නිශ්චිත ව සඳහන් ප්‍රදේශයන් තුළ එකී පනත ක්‍රියාත්මක විය යුතුයයි මෙයින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 ඔක්තෝබර් මස 11 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

### උපලේඛනය

(1) කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි කොළඹ මහ නගර සභාවේ පහත සඳහන් එක් එක් කොට්ඨාශය ඇතුළත් ප්‍රදේශ ;

ප්‍රදේශ අංක 1 ඡන්ද කොට්ඨාශ අංක 29 දෙමටගොඩ.

ප්‍රදේශ අංක 2 ඡන්ද කොට්ඨාශ අංක 30 වනාතමුල්ල.

ප්‍රදේශ අංක 3 ඡන්ද කොට්ඨාශ අංක 32 කුප්පියවත්ත බටහිර.

ප්‍රදේශ අංක 4 ඡන්ද කොට්ඨාශ අංක 34 නාරාහේන්පිට.

(2) පුත්තලම හා හලාවත දිස්ත්‍රික්කය තුළ පිහිටි හලාවත නගර සභා ප්‍රදේශය ;

(3) මාතලේ දිස්ත්‍රික්කය තුළ පිහිටි රත්තොට සුළු නගර සභා ප්‍රදේශය ;

(4) කෑගල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි මාවනැල්ල සුළු නගර සභා ප්‍රදේශය ;

(5) හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ පිහිටි අම්බලන්තොට නගර සභා ප්‍රදේශය.

10-740

## සමඟි මණ්ඩල පනත

### 3 (2) වන වගන්තිය යටතේ වූ දැන්වීම

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් නිවේදනය සමඟ කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමඟි මණ්ඩල පනතේ 3 වන වගන්තියේ (2) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින්, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, රත්නසිරි වික්‍රම නායක වන මම, මීට යා කොට ඇති උපලේඛනයෙහි නිශ්චිත ව සඳහන් එක් එක් ප්‍රදේශය සඳහා සමඟිදායකයින්ගේ මණ්ඩලයක් සංස්ථාපනය කිරීමට අදහස් කරන බවත්, ඒ එක් එක් ප්‍රදේශයෙහි සමඟිදායකයින්ගේ මණ්ඩලයට පත් කළ යුතු තැනැත්තන් සම්බන්ධ යෙන් ඒ වගන්තියේ (3) උප වගන්තිය යටතේ නිර්දේශයන් ප්‍රාදේශිය ආදායම් පාලක නිලධාරි තැනගේ කායර්‍යාලයේ ඇති ආකෘති පත්‍රය මගින් 1970 නොවැම්බර් 30 වන දින හෝ ඊට පෙර මා වෙත ඉදිරිපත් කළ හැකි බවත් මෙයින් දැනුම් දෙමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්.

1970 ඔක්තෝබර් මස 11 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

### උපලේඛනය

(1) කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි කොළඹ මහ නගර සභාවේ පහත සඳහන් එක් එක් කොට්ඨාශය ඇතුළත් ප්‍රදේශ ;

ප්‍රදේශ අංක 1 ඡන්ද කොට්ඨාශ අංක 29 දෙමටගොඩ.

ප්‍රදේශ අංක 2 ඡන්ද කොට්ඨාශ අංක 30 වනාතමුල්ල.

ප්‍රදේශ අංක 3 ඡන්ද කොට්ඨාශ අංක 32 කුප්පියවත්ත බටහිර.

ප්‍රදේශ අංක 4 ඡන්ද කොට්ඨාශ අංක 34 නාරාහේන්පිට.

ප්‍රදේශ අංක 5 ඡන්ද කොට්ඨාශ අංක 44 කිරිල්ලපනේ.

(2) පුත්තලම හා හලාවත දිස්ත්‍රික්කය තුළ පිහිටි හලාවත නගර සභා ප්‍රදේශය ;

(3) මාතලේ දිස්ත්‍රික්කය තුළ පිහිටි රත්තොට සුළු නගර සභා ප්‍රදේශය ;

(4) කළුතර දිස්ත්‍රික්කය තුළ පිහිටි හොරවල ගම් ප්‍රදේශය ;

(5) කෑගල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි මාවනැල්ල සුළු නගර සභා ප්‍රදේශය ;

(6) අම්පාර දිස්ත්‍රික්කය තුළ පිහිටි අක්කරෙයිපත්තු උතුර ගම් කායර්‍ය සභාවේ ඡන්ද කොට්ඨාශ අංක 1 සිට 4 දක්වා ඇතුළත් ප්‍රදේශය ;

(7) අම්පාර දිස්ත්‍රික්කය තුළ පිහිටි අක්කරෙයිපත්තු උතුර ගම් කායර්‍ය සභාවේ ඡන්ද කොට්ඨාශ අංක 5 සිට 8 දක්වා ඇතුළත් ප්‍රදේශය ;

(8) අම්පාර දිස්ත්‍රික්කය තුළ පිහිටි නින්දවූර් ගම් ප්‍රදේශය ;

(9) බදුල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි පට්ටිපොල ගම් ප්‍රදේශය ;

(10) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පිහිටි පොල්ගහවෙල සුළු නගර සභා ප්‍රදේශය ;

(11) රත්නපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි නිවිතිගල ගම් ප්‍රදේශය ;

(12) රත්නපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි පල්ලේපත්තු නවදුන් කෝරලේ ගම් ප්‍රදේශය ;

(13) රත්නපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි පන්නිලපත්තු අටකලන් කෝරලේ ගම් ප්‍රදේශය ;

(14) අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි එප්පාවල ගම් ප්‍රදේශය ;

(15) අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි දකුණු නුවරගම් කෝරලේ ගම් ප්‍රදේශය ;

(16) අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි තඹුත්තේගම ගම් ප්‍රදේශය ;

(17) අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි කට්යාව ගම් ප්‍රදේශය ;

(18) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පිහිටි මහව ගම් ප්‍රදේශය ;

(19) හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ පිහිටි අම්බලන්තොට නගර සභා ප්‍රදේශය.

10-741

අංක : ටී. 23/910/63.

## (1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත් වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරවුල් පනත

### 4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරවුල් පනත (විශේෂ විධිවිධාන) සමග කියැවෙන) දරණ (සංශෝධිත) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 1969 මැයි මස 9 දින අංක 14,853 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 1969 අප්‍රේල් මස 26 වන දින දරන නියෝගයෙන් දෙහිවල, කැම්බල් පෙදෙසේ, අංක 26 හි, ඊ. බී. රයිට් මහතා සහ කොළඹ, ලේක්හවුස් හි, ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම, අතර ඇති 1969 අප්‍රේල් මස 15 දින දරන ආරවුල පිළිබඳව කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳ වූ කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථය කිරීම සඳහා සානදුරේ, ජයතිලක මාවතේ, අංක 27හි, එම්. ඩබ්ලිව්. එස්. කුරේ මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළ යුතුයැයි දැන් පෙනීයන හෙයින්, කම්කරු ඇමති වන මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, එකී නියෝගය අවලංගු කරන අතර, එකී 1969 අප්‍රේල් මස 26 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1970 ඔක්තෝබර් මස 8 දින,
කොළඹ දීය.
10-725

---

අංකය : ටී. 23/910/63

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය

### (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත

### 4(1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත වැඩබලන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව දෙහිවල, කැම්බල් පෙදෙසේ, අංක 26හි, ඊ. බී. රයිට් මහතා

හා

කොළඹ, ලේක්හවුස් හි, ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගම

අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරණ පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කොළඹ 3, ක්ලිෆර්ඩ් ඇවනියු, අංක 23 හි, එන්. ක්‍රිෂ්ණදාසන් මහතා වෙත මෙයින් යොමු කරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1970 ඔක්තෝබර් මස 8 දින,
කොළඹ දීය.
10-725/1

ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

**131 වන අධිකාරිය, කාර්මික ආරාවුල් පනත**

දෙහිවල, කැම්බල් පෙදෙසේ අංක 26 හි, ඊ. බී. රයිට් මහතා

සහ

කොළඹ, ලේක් හවුස් හි, ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම

අතර පවතින කාර්මික ආරාවුලක් පිළිබඳවයි.

**ආරාවුලට හේතුවී පවත්නා කරුණු පිළිබඳ ප්‍රකාශය**

ඊ. බී. රයිට් මහතා සහ ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම අතර ආරවුලට හේතුවී පවත්නා කරුණු පහත සඳහන් පරිදි වේ:—

(අ) ඊ. බී. රයිට් මහතාගෙන් රු. 10ක දඩ මුදලක් අයකිරීම යුක්ති සහගතද,

(ආ) උසස් නිලධාරීන්ට සහ අනෙක් අයට විරුද්ධව අසත්‍ය හා හේතු රහිත චෝදනා නැගීම, අකීකරු බව, උසස් නිලධාරීන්ගේ නියෝගයන් ක්‍රියාත්මක කිරීමට අපොහොසත්වීම හා එක්ව වැඩකරන නිලධාරීන් සමග දබර කිරීම යන චෝදනා සම්බන්ධයෙන් පාලක පක්ෂය විසින් රයිට් මහතාට අවවාද කිරීම යුක්ති සහගතද,

(ඉ) රයිට් මහතා අනිවාර්යයෙන් විශ්‍රාම ගැන්වීම යුක්ති සහගතද, ඔහුට කවර සහනයක් හිමිවිය යුතුද,

(ඊ) 1962 පෙබරවාරි මස 1 වන දින සිට 1964 ජූලි 31 වන දින දක්වා කාල සීමාව තුළ දිනකට පැය 8කට වැඩියෙන් වැඩ කර ඇති (ආහාර ගැනීම සඳහා ඇති පැය 1 ද ඇතුළුව) කාලයට ඊ. බී. රයිට් මහතා අතිකාල දීමනා නොගෙවීම් යුක්ති සහගතද.

1970 සැප්තැම්බර් මස 30 වැනිදා වූ මෙදින, කොළඹ කම්කරු කොමසාරිස් කාර්යාලයේදී දින යොදන ලදී.

ඇම්. මතියාපරනම්,
වැඩබලන කම්කරු කොමසාරිස්.

10-725/2

අංකය : සීඅයිඊ/336/70.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය, (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත, 4(1) වන වගන්තිය යටතේ නියෝගයයි**

මෙම නියෝගය අනුබද්ධිත වැඩබලන කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව

මහනුවර හල්ඔළුව පාරේ, 70 හි, කේ. රත්නවේල් මහතා,

හා

කොළඹ 11, සී ස්ට්‍රීට්, 263හි මර්කන්ටයිල් කෝපරේෂන් ලිමිටඩ් බාරේ රම්බොඩ, රංග්බොඩ වත්තේ අයිතිකරුවන් වන ද රංග්බොඩ එස්ටේටේ ලිමිටඩ්.

අතර කාර්මික ආරවුලක් පවතින හෙයින්ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මීගමුව, ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙරකදෝරු කීර්ති ද සොයිසා මහතාට මෙයින් යොමුකරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1970 ඔක්තෝබර් මස 8 දින,
කොළඹ දීය.

**10-724**

ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

131 වන අධිකාරිය කාර්මික ආරවුල් පනත

මහනුවර, හල්ඔළුව පාරේ 70 හි, කේ. රත්නවේල් මහතා,

සහ

කොළඹ 11, සී ස්ට්‍රීට්, 263 හි මර්කන්ටයිල් කෝපරේෂන් ලිමිටඩ් බාරේ රම්බොඩ, රංග්බොඩ වත්තේ අයිතිකරුවන් වන ද රංග්බොඩ එස්ටේට් ලිමිටඩ්,

අතර පවතින කාර්මික ආරාවුලක් පිළිබඳවයි.

**ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය**

ඉහත සඳහන් පාර්ශවයන් අතර ආරවුලට හේතුවී පවත්නා කාරණය වනුයේ රංග්බොඩ වත්තේ පාලක පක්ෂය විසින් කේ. රත්නවේල් මහතා වතු අධිකාරි තනතුරෙන් පහකිරීම යුක්ති සහගතද, යන්න හා ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න වේ.

1970 සැප්තැම්බර් මස 17 වැනිදා වූ මෙදින, කොළඹ කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ඇම්. මතියාපරනම්,
වැඩබලන කම්කරු කොමසාරිස්.

**10-724**

# ආදයම් හා වියදම් පිළිබඳ වාර්තා

## 1.—1970 ජූනි 30 වැනි දිනට පැවැති ලැබීම් හා ගෙවීම්වලට එක එල්ලේම සම්බන්ධ රජයේ වත්කම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය

**බැරකම් සහ බැර ශේෂ**

| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| ඒකාබද්ධ අරමුදල :— | | | |
| චල ණය : | | | |
| භාණ්ඩාගාර බිල්පත් ... ... | | 1,83,49,76,782 30 | |
| අයබදු සංචිත සහතික ... ... | | 5,18,83,746 74 | |
| ශ්‍රී ලංකා මහා බැංකුවෙන් අත්තිකාරම් : | | | |
| (i) මුදල් නීති පනතේ 89 වැනි වගන්තියේ ප්‍රකාර රජයේ බැර ක්‍රියාකාරිත්වය ... ... | 23,04,00,000 0 | | |
| (ii) ජාත්‍යන්තර මුදල් අරමුදලේ, ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ හා සංවර්ධන බැංකුවේ, ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ හා ආසියානු සංවර්ධන බැංකුවේ දයක මුදල් ගෙවීම සඳහා විශේෂ ණය මුදල්... | 8,94,58,332 72 | | |
| | | 31,98,58,332 72 | |
| පරිපාලන ණය (1ආ) ප්‍රකාශය බලන්න.) ... | | 9,48,55,165 38 | |
| | | 2,30,15,79,027 14 | |
| අරමුදල්ගත ණය :— | | | |
| මධ්‍ය හා දීර්ඝකාලීන ණය ගැනීම් : ... | | 5,14,46,82,942 04 | |
| (1ආ) ප්‍රකාශය 10 වැනි තීරුව බලන්න.) | | | |
| | | 7,44,62,61,969 18 | |
| අඩුකළා : | | | |
| විශේෂ කාර්යයන් සඳහා නීතියෙන් වෙන්කරන ලද අරමුදල් ... ... ... | | 3,04,89,300 0 | |
| | | 7,41,57,72,669 18 | |
| අඩු කළා : | | | |
| 1970.6.30 දිනට එකතු වූ ඌනතාවය ... ... | | 2,55,96,01,285 22 | |
| (1ආ) ප්‍රකාශය බලන්න.) | | | 4,85,61,71,383 96 |
| හදිසි අවස්ථා අරමුදල ... ... ... | | | 22,45,110 0 |
| ප්‍රසිද්ධ වැඩ ණය මුදල ... ... ... | | | 3,04,89,300 0 |
| ජාතික සංවර්ධන අරමුදල :— | | | |
| (i) ජාතික සංවර්ධන බද්ද ... ... | | 7,76,020 85 | |
| (ii) ඉතිරි අතිරික්ත ආදයම් ... ... | | 1,17,045 82 | |
| | | | 8,93,066 67 |
| සංචිතයෝ :— | | | |
| ජාතික සංවර්ධන සංචිත අරමුදල ... ... | | | 13,73,92,451 07 |
| නිදන් අරමුදල ... ... ... | | | 67,87,46,539 34 |

**වත්කම් සහ හර ශේෂ**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| මුදල් හා බැංකු ශේෂ (1) (උ) ප්‍රකාශය බලන්න.) ... ... | | 48,92,528 57 |
| නිකුත් නොකළ ද්‍රව්‍ය හා බඩුබාහිර (1) (ඌ) ප්‍රකාශය බලන්න.) ... | | 11,36,47,155 17 |
| ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවලට දී ඇති අත්තිකාරම් (1එ) ප්‍රකාශය බලන්න.) ... | | 59,45,22,787 97 |
| අත්තිකාරම් ගිණුම්වලින් හා අතිරික්ත ශේෂයන්ගෙන් දෙන ලද ණය (1) (ඒ) ප්‍රකාශය බලන්න.) ... ... ... ... | | 20,49,02,575 85 |
| ආයෝජනයන් හා ණය දීම් :— | | |
| (i) සම්මතයන් හා ණය අරමුදල්වලින් දෙන ලද ණය ... ... | 49,41,71,713 62 | |
| (ii) රජයේ සංස්ථාවල මූලධන ... ... ... | 1,94,26,20,106 44 | |
| (iii) සමාගම්වල කොටස් ... ... ... | 1,26,70,110 0 | |
| (iv) ජාත්‍යන්තර මුදල් ආයතනයන්ට ගෙවන ලද දයක මුදල් ... | 11,57,78,393 07 | |
| (v) දේශීය ආයෝජන (1ඔ) ප්‍රකාශය බලන්න.) ... ... | 75,30,000 0 | |
| | | 2,57,27,70,323 13 |
| නිදන් අරමුදල් ආයෝජනයන් (ගත් මිළට) ... ... ... | | 67,87,46,539 34 |
| ණය මුදල්වලින් පියවා ගත් ප්‍රාග්ධන වැඩ පිළිබඳ වියදම් :— | | |
| (i) දේශීය හා විදේශීය ණය (1ආ) ප්‍රකාශයේ 8 වැනි තීරුව බලන්න.) ... | 2,49,43,36,652 94 | |
| (ii) විසර්ජන පනත යටතේ වූ ණය මුදල් (1ආ) ප්‍රකාශයේ 9 වැනි තීරුව බලන්න.) ... ... ... | 2,41,55,79,500 0 | |
| (iii) විදේශීය ණය වියදම්—වැය ශීර්ෂවලට අය කිරීම සඳහා : | | |
| (අ) පෝලන්ත මහජන සමූහාණ්ඩුවේ ණය ... ... | 73,740 51 | |
| (ආ) ප්‍රජාතන්ත්‍රවාදී ජර්මන් සමූහාණ්ඩුවේ ණය ... ... | 2,37,65,336 92 | |
| (ඇ) ලෝහ වාත්තු කම්හල සඳහා බටහිර ජර්මන් ණය ... | 4,207 93 | |
| (ඈ) ඝන කඩදසි කම්හල සඳහා බටහිර ජර්මන් ණය ... ... | 87,50,618 14 | |
| (ඉ) පහත් බිම්වල ජල බැස්ම සඳහා ජා.ස.නි. ණය ... ... | 37,041 72 | |
| | | 4,94,25,47,098 16 |
| තැන්පත් ඇප මුදල්—ආයෝජන ... ... ... | | 13,00,09,463 66 |

| | | | |
|---|---|---|---|
| සම්මත හා අරමුදල්වලින් කරන ලද ආයෝජනයන් හා ණය දීම :— | | | |
| (i) සම්මතයන් හා ණය අරමුදල්වලින් දෙන ලද ණය... | | 49,41,71,713 62 | |
| (ii) රජයේ සංස්ථාවල මූලධන ... ... | | 1,94,26,20,106 44 | |
| (iii) සමාගම්වල කොටස් ... ... | | 1,26,70,110 0 | |
| (iv) ජාත්‍යන්තර මුදල් ආයතනයන්ට ගෙවන ලද දයක මුදල් ... ... ... | | 11,57,78,393 07 | |
| (v) දේශීය ආයෝජන : | | | |
| (1) ලංකා ගුවන් සේවයේ කොටස් ප්‍රාග්ධනය ... | 15,30,000 0 | | |
| (2) ලංකා බැංකුවේ කොටස් ප්‍රාග්ධනය (ගත්මිළට) | 30,00,000 0 | | |
| (3) මහජන බැංකුවේ කොටස් ප්‍රාග්ධනය ... | 30,00,000 0 | | |
| | | 75,30,000 0 | |
| | | | 2,57,27,70,323 13 |
| තැන්පත් මුදල් හා වෙනත් බැරකම් (1ඈ) ප්‍රකාශය බලන්න) | | | 68,58,80,858 14 |
| විවිධ අරමුදල් (1ඉ) ප්‍රකාශය බලන්න.) ... ... | | | 1,85,36,558 72 |
| ලංකා-චීන වෙළඳ ගිණුම ... ... | | | 10,68,10,197 28 |
| ශ්‍රී ලංකා මහා බැංකුවේ විදේශ ආධාර ප්‍රතිරූපික අරමුදල් (1ඊ) ප්‍රකාශය බලන්න.) ... ... | | | 2,20,93,219 88 |
| තැන්පත් ඇප මුදල් ... ... ... | | | 13,00,09,463 66 |
| | | | 9,24,20,38,471 85 |

9,24,20,38,471 85

1970 ඔක්තෝබර් මස 8 වැනි ද,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

සී. ඒ. කුරේ,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

(අ) මුදල් අමාත්‍යවරයා විසින් අත්සන් කරන ලද ජා.මු.අ.ජං.ස.ස.බැ.ජං.ස.සං. හා අ.සං.බැ. දෙන ලද පොලී නොදෙන ගනුදෙනු කළ නො හැකි නෝට්ටුවලින් ඇති කරන ලද අවිනිශ්චිත බැරකම් රු. 50,82,86,376.12 වේ.

(ආ) ජාතික නිවාස පනතේ (401 පරිච්ඡේදය) 6 (1) වගන්තිය සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ 1954.11.4, 1956.2.8 සහ 1957.9.19 දිනයන්හි සම්මත කරන ලද යෝජනා යටතේ ජාතික නිවාස ණයකර නිකුත් කිරීමෙන් අවිනිශ්චිත බැරකමක් ඇතිකර තිබේ. 1970.6.30 දිනට ඉතිරිව ඇති දළ ණයකර ප්‍රමාණය රු. 11,60,00,000 කි. ණයකර ආපසු ගෙවීම සඳහා ඇති කරන ලද නිදන් අරමුදලේ භාරකරුවන් 1970.6.30 දිනට මෙම වගකීම වෙනුවෙන් රු. 4,84,41,996 ක් වටිනා ආයෝජන ඇත. එම නිසා ශුද්ධ වගකීම රු. 6,75,58,004 වේ.

(ඇ) 1956 අංක 49 දරණ ලංකා රජයේ උකස් බැංකු සංශෝධන පනතින් සංශෝධිත ලංකා රජයේ උකස් බැංකු ආඥාපනතේ (398 පරිච්ඡේදය) IV පරිච්ඡේදය යටතේ ලංකා රජයේ උකස් බැංකු ණයකර නිකුත් කිරීමෙන් අවිනිශ්චිත බැරකමක් ඇතිකර තිබේ. 1970.6.30 දිනට නිකුත් කර ගෙවීමට ඉතිරිව තිබුණු දළ මුදල රු. 3,22,50,000 කි.

## 1 (අ)—1970.6.30 දිනට පැවති රාජ්‍ය ණය පිළිබඳ ප්‍රකාශය

| ණය මුදල (1) | ණය මුදල වශයෙන් ලබා ගැනීමට අවසර දුන් මුදල් ප්‍රමාණය (2) රු. ශ. | 1970.6.30 දිනට ලබාගන්නා ලද ණය මුදල (3) රු. ශ. | 70.6.30 දිනට ණය මුදලට අය කරණ ලද ප්‍රමාණය හෝ ඒකාබද්ධ අරමුදලට බැර කරන ලද මුදල (4) රු. ශ. | ණය ලබා ගැනීමේ වියදම් (මූලික වියදම්) (5) රු. ශ. | වැය නොවූ ශේෂයෝ (6) රු. ශ. | 1967 වර්ෂයේ රුපියල අවම කිරීමේ හේතු වෙන් වැඩි වූ ණය වගකීම් (7) රු. ශ. | 1970.6.30 දිනට (ණය මුදලට) ගෙවීම්වලට වැඩියෙන් අයකරන ලද මුදල (8) රු. ශ. | 1970.6.30 දිනට. ගෙවීම්වලට වැඩියෙන් ඒකාබද්ධ අරමුදලට බැර කරන ලද මුදල (9) රු. ශ. | 1970.6.30 දින ණය මුදලේ ළඟ බැරකම (10) රු. ශ. | 1970.6.30 දිනට ණය මුදලේ දළ ගෙවීම (11) රු. ශ. | 1970.6.30 දිනට නිදන් අරමුදල් (ආයක දීමනා (ආ) (මූනක වට්නා) කම) (12) රු. ශ. | 1970.6.30 දිනට ශුද්ධ වගකීම (13) රු. ශ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පොදු වැඩ ණය 1937 (413 පරිච්ඡේදය) | 100,294,830 67 | 100,294,830 67 | 95,888,742 22 | 294,841 21 | 4,406,088 45 | — | 26,083,211 55 | | 30,489,300 0 | 69,805,530 67 | 19,737,953 20 | 10,751,346 80 |
| ස්වදේශාරක්ෂක ණය 1942 (405 පරිච්ඡේදය) | 50,000,000 0 | 50,000,000 0 | 50,000,000 0 | 24,973 97 | — | — | 997,900 0 | | 997,900 0 | 49,002,100 0 | 572,794 60 | 425,105 40 |
| ජාතික සංවර්ධන ණය 1945 (408 පරිච්ඡේදය) | 200,000,000 0 | 200,000,000 0 | 200,000,000 0 | 70,594 79 | — | — | 141,384,700 0 | | 141,384,700 0 | 58,615,300 0 | 88,635,453 20 | 52,749,246 80 |
| ජාතික සංවර්ධන ණය 1950 (409 පරිච්ඡේදය) | 400,000,000 0 | 399,454,168 0 | 399,454,168 0 | 168,683 87 | — | — | 360,000,000 0 | | 360,000,000 0 | 39,454,168 0 | — | 360,000,000 0 |
| ලංකා සංවර්ධන ණය 1954 (407 පරිච්ඡේදය) | 1,000,000,000 0 | | | | | | | | | | | |
| (අ) ප්‍ර.සං.ජා.බැ. ණය (101 සීඊ) (i) | | 88,919,040 55 | 88,919,040 55 | — | — | 13,207,566.80 | 55,439,458 35 | | 55,439,458 35 | 33,479,582 20 | — | 55,439,458 35 |
| (ආ) ප්‍ර.සං.ජා.බැ. ණය (209 සීඊ) (ii) | | 40,643,286 66 | 40,643,286 66 | — | — | 5,850,507 84 | 25,300,673 92 | | 25,300,673 92 | 15,342,612 74 | — | 25,300,673 92 |
| (ඇ) ප්‍ර.සං.ජා.බැ. ණය (283 සීඊ) (iii) | | 82,089,037 32 | 82,089,037 32 | — | — | 14,915,870 66 | 67,988,301 02 | | 67,988,301 02 | 14,100,736 30 | — | 67,988,301 02 |
| (ඈ) එක්සත් රාජධානි ණය | | 71,428,427 85 | 71,428,427 85 | 1,215,892 39 | — | 4,761,761 18 | 71,428,427 85 | | 71,428,427 85 | — | 16,071,396 27 | 55,357,031 58 |
| (ඉ) ස්වදේශීය ණය | | 725,149,700 0 | 725,149,697 75 | 438,260 56 | 2 25 | — | 654,340,997 75 | | 654,341,000 0 | 70,808,700 0 | 242,210,356 50 | 412,130,643 50 |
| *1960 අංක 6 දරණ විසර්ජන පණත | 470,000,000 0 | 20,000,000 0 | 20,000,000 0 | — | — | — | — | 20,000,000 0 | 20,000,000 0 | — | 4,800,000 0 | 15,200,000 0 |
| *1961 අංක 64 දරණ විසර්ජන පණත | 700,000,000 0 | 145,000,000 0 | 145,000,000 0 | — | — | — | — | 138,253,600 0 | 138,253,600 0 | 6,746,400 0 | 28,959,539 0 | 109,294,061 0 |
| *1962 අංක 30 දරණ විසර්ජන පණත | 500,000,000 0 | 221,100,600 0 | 221,100,600 0 | — | — | — | — | 196,563,500 0 | 196,563,500 0 | 24,537,100 0 | 35,347,209 0 | 161,216,291 0 |
| *1963 අංක 7 දරණ විසර්ජන පණත | 600,000,000 0 | 245,000,000 0 | 245,000,000 0 | — | — | — | — | 245,000,000 0 | 245,000,000 0 | — | 40,200,000 0 | 204,800,000 0 |
| *1964 අංක 23 දරණ විසර්ජන පණත | 660,000,000 0 | 253,142,100 0 | 253,142,100 0 | — | — | — | — | 253,142,100 0 | 253,142,100 0 | — | 34,293,815 0 | 218,848,285 0 |
| *1965 අංක 7 දරණ විසර්ජන පණත | 620,000,000..0 | 325,000,000 0 | 325,000,000 0 | — | — | — | — | 325,000,000 0 | 325,000,000 0 | — | 34,601,383 0 | 290,398,617 0 |
| *1966 අංක 22 දරණ විසර්ජන පනත | 910,000,000 0 | 340,000,000 0 | 340,000,000 0 | — | — | — | — | 340,000,000 0 | 340,000,000 0 | — | 26,128,860 0 | 313,871,140 0 |
| *1967 අංක 15 දරණ විසර්ජන පනත | 995,000,000 0 | 350,000,000 0 | 350,000,000 0 | — | — | — | — | 350,000,000 0 | 350,000,000 0 | — | 15,262,500 0 | 334,737,500 0 |
| *1968 අංක 38 දරණ විසර්ජන පණත | 1,060,000,000 0 | 240,000,000 0 | 340,000,000 0 | — | — | — | — | 340,000,000 0 | 340,000,000 0 | — | 4,606,250 0 | 335,393,750 0 |
| *1969 අංක 30 දරණ විසර්ජන පණත | 1,150,000,000 0 | 207,620,300 0 | 207,620,300 0 | — | — | — | — | 207,620,300 0 | 207,620,300 0 | — | — | 207,620,300 0 |
| විදේශීය ණය (1957 අංක 29 දරණ පනත) සංශෝධිත (අ)— | | | | | | | | | | | | |
| ජා.ස.පා. ණය (අයි.සී.ඒ.එක්ස්. 83–1) (i) | | 14,810,228 16 | 14,810,228 16 | — | — | 2,905,466 25 | 14,186,830 16 | | 14,186,830 16 | 623,398 0 | — | 14,186,830 16 |
| ජා.ස.පා. ණය (අයි.සී.ඒ.එක්ස්. 83–2) (ii) | | 12,977,356 41 | 12,977,536 41 | — | — | 2,567,216,57 | 12,352,285 80 | | 12,352,285 80 | 625,250 61 | — | 12,352,285 80 |
| ජා.ස.පා. ණය (අයි.සී.ඒ.එක්ස්. 83–3) (iii) | | 32,259,887 97 | 30,289,836 0 | — | 1,970,051 97 | 6,468,292 21 | 28,891,806 50 | | 30,861,858 47 | 1,398,029 50 | — | 30,861,858 47 |
| ජා.ස.පා. ණය (අයි.සී.ඒ.එක්ස්. 83–4(iv) | | 5,327,458 39 | 5,327,458 29 | — | — | — | 5,327,458 29 | | 5,327,458 29 | — | — | 5,327,458 29 |
| ජා.සං.ආ. ණය (383–ජී–009) (v) | | 7,012,527, 21 | 7,012,527 21 | — | — | — | 7,007,627 21 | | 7,007,627 21 | 4,900 0 | — | 7,007,627 21 |
| ජා.සං.නි. ණය (383–එන්–010) | | 42,580,545 82 | 42,554,835 93 | — | 25,709 89 | 6,794,526 73 | 42,554,835 93 | | 42,580,545 82 | — | — | 42,580,545 82 |
| ජා.සං.නි. ණය (383–එච්–012) | | 43,433,600 03 | 41,367,003 55 | — | 2,066,596 48 | 4,936,374 14 | 41,367,003 55 | | 43,433,600 03 | — | — | 43,433,600 03 |
| ජා.සං.නි. ණය (383–ජී–011) | | 15,168,149 96 | 13,153,261 31 | — | 2,014,888 65 | — | 13,153,261 31 | | 15,168,149 96 | — | — | 15,168,149 96 |
| ජා.සං.නි. ණය (383–එච්–014) | | 2,735,772 04 | — | — | 2,735,772 04 | — | — | | 2,735,772 04 | — | — | 2,735,772 04 |
| ස.ණ.අ. ණය (ඩී.එල්.එෆ්–4) | | 8,156,474 93 | 8,156,474 93 | — | — | 1,128,178 35 | 4,187,972 92 | | 4,187,972 92 | 3,968,502 01 | — | 4,187,972 92 |
| ස.ණ.අ. ණය (ඩී.එල්.එෆ්–9) | | 4,143,165 79 | 4,143,165 79 | — | — | 686,022 94 | 2,942,278 93 | | 2,942,278 93 | 1,200,886 86 | — | 2,942,278 93 |
| ස.ණ.අ. ණය (ඩී.එල් එෆ්–156) | | 489,218 46 | 489,218 46 | — | — | 46,349 96 | 195,633 16 | | 195,633 16 | 293,585 30 | — | 195,633 16 |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| අ.ඒ.ජ. (ජ.නී. 480) ණය 1967 | 45,038,264 13 | 45,038,264 13 | — | — | — | 43,847,264 13 | 43,847,264 13 | 1,191,000 0 | — | 43,847,264 13 |
| අ.ඒ.ජ. (ජ.නී. 480) ණය 1968 | 82,667,264 26 | 82,391,848 45 | — | 275,415 81 | — | 82,391,848 45 | 82,667,264 26 | — | — | 82,667,264 26 |
| අ.ඒ.ජ. (ජ.නී. 480) ණය 1969 | 82,626,113 44 | 43,545,111 31 | — | 39,081,002 13 | — | 43,545,111 31 | 82,626,113 44 | — | — | 82,626,113 44 |
| බෙල්ජෙට් රේන්ජර් හෙලිකොප්ටර් මිළදී ගැනීම සඳහා අ.ඒ.ජ. ණය | 1,835,287 13 | 1,835,287 13 | — | — | — | 1,224,026 87 | 1,224,026 87 | 611,260 26 | — | 1,224,026 87 |
| ජා. සං. ණය (අංක 121 සී.ර්.) | 2,822,170 12 | — | — | 2,282,170 12 | — | — | 2,282,170 12 | — | — | 2,282,170 12 |
| ජා.සං.සං. ණය (අංක 168 සී.ර්.) | 37,041 72 | — | — | 37,041 72 | — | — | 37,041 72 | — | — | 37,041 72 |
| කැනේඩියානු භාණ්ඩ ණය (I) | 5,172,673 83 | 5,172,673 83 | — | — | 1,034,528 87 | 5,172,673 83 | 5,172,673 83 | — | — | 5,172,673 83 |
| කැනේඩියානු භාණ්ඩ ණය (II) | 2,751,859 68 | 2,751,859 68 | — | — | — | 2,751,859 68 | 2,751,859 68 | — | — | 2,751,859 68 |
| ඇස්බැස්ටෝස් කෙඳි මිළදී ගැනීම සඳහා කැනේඩියානු භාණ්ඩ ණය (III) | 6,871,926 20 | 6,871,925 20 | — | — | — | 6,871,926 20 | 6,871,926 20 | — | — | 6,871,926 20 |
| මුද්‍රණ කඩදාසි මිළදී ගැනීම සඳහා කැනේඩියානු භාණ්ඩ ණය 1969–1 | 5,383,041 77 | 2,701,055 50 | — | 2,681,986 27 | — | 2,701,055 50 | 5,383,041 77 | — | — | 5,383,041 77 |
| ඇස්බැස්ටෝස් කෙඳි මිළදී ගැනීම සඳහා කැනේඩියානු භාණ්ඩ ණය 1969–2 | 4,727,327 44 | — | — | 4,727,327 44 | — | — | 4,727,327 44 | — | — | 4,727,327 44 |
| මුද්‍රණ කඩදාසි මිළදී ගැනීම සඳහා කැනේඩියානු භාණ්ඩ ණය 1969–3 | 1,855,128 18 | — | — | 1,856,128 18 | — | — | 1,856,128 18 | — | — | 1,856,128 18 |
| මුද්‍රණ කඩදාසි හා ඇස්බැස්ටෝස් කෙඳි මිළදී ගැනීම සඳහා කැනේඩියානු අ.ජා.ර.ස. ණය | 46,421,830 54 | 44,581,322 41 | — | 1,841,508 13 | 5,025,613 06 | 24,475,549 98 | 26,317,058 11 | 20,105,772 43 | — | 26,317,058 11 |
| කටුනායක ගුවන්තොටුපල සංවර්ධනය සඳහා කැනේඩියානු ණය | 8,012,191 54 | 8,012,191 45 | — | — | 1,425,143 72 | 8,012,191 45 | 8,012,191 45 | — | — | 8,012,191 45 |
| කැනේඩියානු ණය—මස්කෙළිඔය ජලවිදුලි යෝජනා ක්‍රමය—2 වැනි හා 3 වැනි අදියර සඳහා | 2,519,275 86 | 2,464,987 36 | — | 54,288 50 | — | 2,464,987 36 | 2,519,275 86 | — | — | 2,519,275 86 |
| එක්සත් රාජධානි/ණය මාලාව—1961 | 36,821,874 05 | 36,679,017 20 | — | 142,856,85 | 936,162 26 | 3,799,992 46 | 3,942,849 31 | 32,879,024 74 | — | 3,942,849 31 |
| එක්සත් රාජධානි/ලංකා භාණ්ඩ ණය—1965 | 28,571,371 14 | 28,571,371 14 | — | — | 1,785,267 52 | 28,086,017 98 | 28,086,017 98 | 485,353 16 | — | 28,086,017 98 |
| එක්සත් රාජධානි/ලංකා භාණ්ඩ ණය—1966–1 | 22,428,526 35 | 22,428,526 35 | — | — | 1,384,065 77 | 22,335,738 25 | 22,335,738 25 | 92,788 10 | — | 22,335,738 25 |
| එක්සත් රාජධානි/ලංකා භාණ්ඩ ණය—1966–2 | 28,571,371 12 | 28,571,371 12 | — | — | 1,443,550 20 | 28,450,032 83 | 28,450,032 83 | 121,338 29 | — | 28,450,032 83 |
| එක්සත් රාජධානි/ලංකා භාණ්ඩ ණය—1967–1 | 22,428,526 32 | 22,428,526 32 | — | — | 785,996 85 | 22,335,738 22 | 22,335,738 22 | 92,788 10 | — | 22,335,738 22 |
| එක්සත් රාජධානි/ලංකා භාණ්ඩ ණය—1967–2 | 28,558,536 18 | 27,172,165 58 | — | 1,386,370 60 | 14,432 36 | 27,172,165 58 | 28,558,536 18 | — | — | 28,558,536 18 |
| එක්සත් රාජධානි/ලංකා භාණ්ඩ ණය—1968–1 | 20,832,866 79 | 20,161,783 23 | — | 671,083 56 | — | 20,161,783 23 | 20,832,866 79 | — | — | 20,832,866 79 |
| එක්සත් රාජධානි/ලංකා භාණ්ඩ ණය—1968–2 | 32,577,124 22 | 26,031,497 54 | — | 6,545,626 68 | — | 26,031,497 54 | 32,577,124 22 | — | — | 32,577,124 22 |
| එක්සත් රාජධානි/ලංකා භාණ්ඩ ණය—1969–1 | 29,986,289 0 | 918,396 49 | — | 29,067,892 51 | — | 918,396 49 | 29,986,289 0 | — | — | 29,986,289 0 |
| එ.සෝ.ස.ස. ණය මාලාව | 115,931,963 05 | 115,619,861 42 | — | 312,101 63 | 20,534,441 11 | 83,451,790 20 | 83,763,891 83 | 32,168,071 22 | — | 83,763,891 83 |
| එ.සෝ.ස.ස ණය | 254,066 10 | — | — | 254,066 10 | — | 13,491 87 | 240,574 23 | 13,491 87 | — | 240,574 23 |
| චීන ණය—I | 49,999,983 24 | 49,999,983 24 | — | — | — | 29,287,891 05 | 29,287,891 05 | 20,712,092 19 | — | 29,287,891 05 |
| චීන ණය—II | 6,272,841 0 | 6,272,841 0 | — | — | — | 5,018,272 80 | 5,018,272 80 | 1,254,568 20 | — | 5,018,272 80 |
| සිමෙන්ති කර්මාන්තය සඳහා බටහිර ජර්මන් ක්‍රෙඩිටන්ස් ටාල්ට් ණය (ඒ.එල්. 47) | 49,107,485 83 | 49,107,485 83 | — | — | 7,998,301 49 | 30,898,611 76 | 30,898,611 77 | 18,208,874 07 | — | 30,898,611 76 |
| වරාය සංවර්ධනය සඳහා බටහිර ජර්මන් ක්‍රෙඩිටන්ස්ටාල්ට් ණය (ඒ.එල්. 48) | 11,343,040 78 | 11,343,040 78 | — | — | 1,364,640 86 | 3,143,790 64 | 3,143,790 64 | 8,199,250 14 | — | 3,143,790 64 |
| භාණ්ඩ සඳහා බටහිර ජර්මන් ක්‍රෙඩිටන්ස්ටාල්ට් ණය (ඒ.එල්. 270) | 52,042,519 26 | 52,042,519 26 | — | — | 9,523,776 35 | 52,042,519 26 | 52,042,519 26 | — | — | 52,042,519 26 |
| භාණ්ඩ සඳහා බටහිර ජර්මන් ක්‍රෙඩිටන්ස්ටාල්ට් ණය (ඒ.එල්. 323) | 40,658,218 18 | 40,374,912 80 | — | 283,305 38 | 4,212,138 42 | 40,374,912 80 | 40,658,218 18 | — | — | 40,658,218 18 |
| විනාවට්ට් වත්තු කම්හලක් සඳහා බටහිර ජර්මන් ක්‍රෙඩිටන්ස්ටාල්ට් ණය (ඒ.එල් 352) | 6,473,538 0 | 6,395,100 97 | — | 78,437 03 | 608,417 08 | 6,395,100 97 | 6,473,538 0 | — | — | 6,473,538 0 |
| භාණ්ඩ සඳහා බටහිර ජර්මන් ක්‍රෙඩිටන්ස්ටාල්ට් ණය (ඒ.එල්. 370) | 16,263,287 27 | 16,062,554 54 | — | 200,732 73 | — | 16,062,554 54 | 16,263,287 27 | — | — | 16,263,287 27 |

| ණය මුදල | ණය මුදල වශයෙන් ලබා ගැනීමට අවසර දුන් මුදල් ප්‍රමාණය | 1970.6.30 දිනට ලබාගන්නා ලද ණය මුදල | 70.6.30 දිනට ණය මුදලට අය කරණ ලද ප්‍රමාණය හෝ ඒකාබද්ධ අරමුදලට බැර කරන ලද මුදල | ණය ලබා ගැනීමේ වියදම් (මූලික වියදම්) | වැය නොවූ ශේෂයෝ | 1967 වර්ෂයේ රුපියල අවම කිරීමේ හේතුවෙන් වැඩි වූ ණය වගකීම | 1970.6.30 දිනට (ණය මුදලට) ගෙවීම්වලට වැඩියෙන් අයකරන ලද මුදල | 1970.6.30 දිනට ගෙවීම්වලට වැඩියෙන් ඒකාබද්ධ අරමුදලට බැර කරන ලද මුදල | 1970.6.30 දින ණය මුදලේ දළ බැරකම | 1970.6.30 දිනට ණය මුදලේ දළ ගෙවීම | 1970.6.30 දිනට නිදන් අරමුදල් (දායක දීමනා) (ආ) (මූනක වටිනා කම) | 1970.6.30 දිනට ශුද්ධ වගකීම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (1) | (2) | (3) | (4) | (5) | (6) | (7) | (8) | (9) | (10) | (11) | (12) | (13) |
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ |
| ඝන කඩදාසි කම්හලක් සඳහා බටහිර ජර්මන් ක්‍රෙඩිටන්ස්ටාල්ට් ණය (ඒ.එල්. 351) | | 24,769,204 43 | 11,319,986 29 | — | 13,449,218 14 | — | 11,319,986 29 | — | 24,769,204 43 | — | — | 24,769,204 43 |
| භාණ්ඩ සඳහා බට .ර ජර්මන් ක්‍රෙඩිටන්ස්ටාල්ට් ණය (ඒ.එල්. 414) | | 16,263,287 29 | 7,074,133 22 | — | 9,189,154 07 | — | 7,074,133 22 | — | 16,263,287 29 | — | — | 16,263,287 29 |
| භාණ්ඩ සඳහා බටහිර ජර්මන් ක්‍රෙඩිටන්ස්ටාල්ට් ණය (ඒ.එල්. 486) | | 8,190,065 18 | — | — | 8,190,065 18 | — | — | — | 8,190,065 18 | — | — | 8,190,065 18 |
| යුගෝස්ලාවියානු ණය මාලාව | | 10,164,034 51 | 9,784,749 56 | — | 379,284 95 | 1,091,242 98 | 1,843,114 72 | — | 2,222,399 67 | 7,941,634 84 | — | 2,222,399 67 |
| ප්‍රංශ සෝසියා ණය මාලාව | | 8,425,090 21 | 8,425,090 21 | — | — | 1,258,823 50 | 1,498,627 75 | — | 1,498,627 75 | 6,926,462 46 | — | 1,498,627 75 |
| ප්‍රංශ රජයේ භාණ්ඩ ණය—1966 | | 39,389,243 64 | 38,869,014 79 | — | 520,228 85 | 4,053,081 50 | 23,765,818 71 | — | 24,286,047 56 | 15,103,196 08 | — | 24,286,047 56 |
| ප්‍රංශ රජයේ භාණ්ඩ ණය—1968 | | 22,432,970 56 | 7,852,074 52 | — | 14,580,896 04 | — | 6,214,423 36 | — | 20,795,319 40 | 1,637,651 16 | — | 20,795,319 40 |
| ප්‍රංශ රජයේ භාණ්ඩ ණය—1969 | | 2,097,136 73 | — | — | 2,097,136 73 | — | — | — | 2,097,136 73 | — | — | 2,097,136 73 |
| පෝලන්ත ණය මාලාව | | 6,786,580 08 | 4,545,008 27 | — | 2,241,571 81 | 727,471 34 | 898,280 25 | — | 3,139,825 06 | 3,646,728 02 | — | 3,139,852 06 |
| ජපන්/ලංකා භාණ්ඩ ණය 1966-1 | | 29,652,389 60 | 29,652,389 60 | — | — | 5,930,513 78 | 17,684,692 57 | — | 17,684,692 57 | 11,967,697 03 | — | 17,684,692 57 |
| ජපන්/ලංකා භාණ්ඩ ණය 1966-2 | | 29,358,193 77 | 29,358.193 77 | — | — | 4,506,983 12 | 20,373,970 47 | — | 20,373,970 47 | 8,984,223 30 | — | 20,373,970 47 |
| ජපන්/ලංකා භාණ්ඩ ණය 1967-1 | | 29,740,403 96 | 29,750,403 96 | — | — | — | 29,750,403 96 | — | 29,750,403 96 | — | — | 29,750,403,96 |
| ජපන්/ලංකා භාණ්ඩ ණය 1938 | | 29,068,907 54 | 20,324,149 12 | — | 8,744,758 42 | — | 20,324,149 12 | — | 29,068,907 54 | — | — | 29,068,907 54 |
| ජපන්/ලංකා භාණ්ඩ ණය 1969 | | 5,312,086 68 | — | — | 5,312,086 68 | — | — | — | 5,312,086 68 | — | — | 5,312,086 68 |
| ඉන්දියානු රජයේ භාණ්ඩ ණය—II | | 33,687,877 98 | 24,081,514 30 | — | 9,606,363 68 | — | 22,783,943 17 | — | 32,390,306 85 | 1,297,571 13 | — | 32,390,306 85 |
| ඉන්දියානු රජයේ භාණ්ඩ ණය—III | | 12,342,897 30 | — | — | 12,342,897 30 | — | — | — | 12,342,897 30 | — | — | 12,342,897 30 |
| ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ ණය මාලාව | | 118,399,799 13 | 88,094,366 57 | — | 30,305,432 56 | 299,911 27 | 86,262,635 66 | — | 1,16,568,068 22 | 1,831,730 91 | — | 116,568,068 22 |
| එංගලන්තයේ සීමාසහිත නැෂනල් සහ ග්‍රින්ඩ්ලේස් බැංකු ණය—පවුම් 275,000 | | 3,928,563 53 | — | — | 3,928,563 53 | — | — | — | 3,928,563 53 | — | — | 3,928,563 53 |
| ඩෙන්මාර්ක් රජයේ ණය—1968 | | 8,880,680 06 | — | — | 8,880,680 06 | — | — | — | 8,880,680 06 | — | — | 8,880,680 06 |
| | | 5,730,162,291 93 | 5,495,395,502 83 | 2,213,246 79 | 234,766,789 10 | 141,408,077 33 | 2,494,336,652 94 | 2,415,579,500 0 | 5,144,682,942 04 | 585,479,349 89 | 591,427,509 77 | 4,553,255,432 27 |

*(අ) සංශෝධිත 1957 අංක 29 දරණ විදේශීය ණය පනතින් ණය ලබාගැනීමේ සීමාවන් නියම කොට නැත. කෙසේ වුවත්, 1960-61 මුදල් වර්ෂයේ සිට සෑම මුදල් වර්ෂයකම මෙම ණය මුදල් යටතේ ලබාගන්නා ණය ප්‍රමාණය ඒ ඒ විසර්ජන පනත්වලින් නියම කොට ඇති ප්‍රමාණයන්ගෙන් මා වේ.

(ආ) මෙම නිදන් අරමුදල් දායක දීමනා ණය මුදල් ආපසු ගෙවීම සඳහා ඇති නිදන් අරමුදල් භාරකරුවන් විසින්රි ආයෝජනය කොට ඇත. 1970.6.30 දිනට මෙම ආයෝජනයන්ගේ වෙළඳපොලේ කක්සේරු අගය රු. 70,20,82,345.00කි.

### 1(ආ) පාලන ණය ගැනීම්

| | රු. | ශත. |
|---|---|---|
| රබර් නැවත වගා කිරීමේ ආධාර අරමුදල | 50,00,000 | 0 |
| තේ ආධාර අරමුදල | 4,91,00,000 | 0 |
| අමෙරිකාවේ පී. ඇල්. 480 ඩී. ඇල්. එෆ්. සහ අයි. සී. ඒ. ණය ගිවිසුම්වලින් ගත් ණය | 1,52,68,863 | 75 |
| ලංකා රක්ෂණ සංස්ථාව | 65,00,000 | 0 |
| ලංකා ගුවන් සේවා සමාගම | 67,561 | 63 |
| ලංකා සංචාරක මණ්ඩලය | 7,50,000 | 0 |
| ලංකා නැව් සංස්ථාව | 7,68,740 | 0 |
| සීමාසහිත ආසියානු හෝටල් සංස්ථාව | 60,00,000 | 0 |
| ජාතික ලුණු සංස්ථාව | 5,00,000 | 0 |
| රජයේ පොහොර සංස්ථාව | 9,00,000 | 0 |
| ලංකා ඛනිජතෙල් සංස්ථාව | 1,00,00,000 | 0 |
| | 9,48,55,165 | 38 |

### 1(ඇ) ඒකාබද්ධ අරමුදලට ගිණුම

| | | |
|---|---|---|
| 1969 ඔක්තෝබර් 1 වැනි දිනට පැවැති බැර ශේෂය | | 4,48,51,55,559 31 |
| ලැබීම් එකතුව :— | | |
| 1969.10.1 දින සිට 1970.6.30 දින දක්වා ආදයම | 1,94,11,94,205 99 | |
| 1970.6.30 විසර්ජන පනත යටතේ ලත් ණය | 20,55,95,300 0 | |
| මධ්‍ය හා දීර්ඝකාලීන ණය ගැනීම් (ශුද්ධ) | 36,01,18,807 31 | |
| කොටිකාලීන ණය (ශුද්ධ) | 11,76,19,142 05 | |
| 1929 පොදු වැඩ ණය ගෙවීම | 1,78,57,106 96 | |
| | 2,64,23,84,[illegible]62 31 | |
| අඩුකළා: | | |
| 1969.10.1 සිට 1970.6.30 දිනට වියදම් | 2,27,13,68,737 66 | 37,10,15,824 65 |
| 1970.6.30 දිනට පැවති බැර ශේෂය | | 4,85,61,71,383 96 |
| සැ. යු.—1969.10.1 දිනට එකතු වූ ඌනතාවය | 2,42,74,92,053 55 | |
| එකතු කළා: | | |
| 69.10.1 සිට 70.6.30 දින දක්වා වියදම | 2,27,13,68,737 66 | |
| දේශිය ආයෝජන | 75,30,000 0 | |
| | 4,70,63,90,791 21 | |
| අඩු කළා: | | |
| ආදයම සහ විසර්ජන පණත් ණය 69.10.1 සිට 70.6.30 දක්වා | 2,14,67,89,505 99 | |
| | 2,55,96,01,285 22 | |

### 1(ඇ)—තැන්පත් මුදල් හා වෙනත් බැරකම්

| | රු. | ශත. |
|---|---|---|
| අරක්කු තොග ගබඩා ගිණුම | 8,10,60,122 | 09 |
| ක්‍රවුන් ඒජන්තවරුන්ගේ ජංගම ගිණුම | 9,46,234 | 78 |
| රේගු දෙපාර්තමේන්තුවේ සෙස් එකතු කිරීමෙන් | 54,38,988 | 49 |
| මුදල් නොගෙවූ අණකරයෝ | 5,882 | 32 |
| කච්චේරි තැන්පත් මුදල් | 7,50,68,175 | 67 |
| ක්‍රවුන් ඒජන්තවරුන්ගේ හවුල් ඒකාබද්ධ අරමුදල | 1,58,82,844 | 58 |
| නඩු කියන්නන් විසින් තැන්පත් කර ඇති මුදල් | 30,66,786 | 34 |
| කොළඹ ක්‍රමය යටතේ මුදල් ආධාර | 7,20,12,042 | 61 |
| අමෙරිකා එක්සත් ජනපද රාජ්‍යයෙන් ආධාර | 71,348 | 67 |
| අමෙරිකා එක්සත් ජනපද රාජ්‍යයේ කෘෂි ද්‍රව්‍ය ආධාර ගිණුම | 12,83,930 | 89 |
| එ. ජා. ළමා හදිසි අවස්ථා අරමුදල් ආධාර | 29,195 | 62 |
| ජගත් සෞඛ්‍ය සංවිධාන ආධාර | 1,47,100 | 07 |
| ජගත් ආහාර සංවිධාන ආධාර | 18,400 | 19 |
| වැඩ සටහන් ආධාර ප්‍රදානය ගිණුම | 3,30,27,257 | 67 |
| එක්සත් රාජධානි/ලංකා ආහාර ආධාර ප්‍රදාන | 1,42,67,325 | 50 |
| චීන මහජන සමූහාණ්ඩුවේ ආර්ථික ආධාර ප්‍රදාන—1957.9.19 දින දරණ ගිවිසුම | 17,21,047 | 31 |
| අනිකුත් ආණ්ඩුවල සහ ඒජන්සිවල | 22,18,199 | 61 |
| අනිකුත් දෙපාර්තමේන්තු | 37,96,15,975 | 73 |
| | 68,58,80,858 | 14 |

### 1 (ඉ)—විවිධ අරමුදල්

| | රු. | ශ. |
|---|---|---|
| ගුවන් තොටුපල් අරමුදල | 5,87,439 | 80 |
| බණ්ඩාරනායක අනුස්මරණ අරමුදල | 19,913 | 10 |
| අස්වැන්නරක්ෂණ අරමුදල | 32,96,633 | 60 |
| නියං සහන අරමුදල | 6,478 | 76 |
| ආහාර නිෂ්පාදන අරමුදල | 30,45,846 | 35 |
| ආණ්ඩුවේ සුළි සුළං සහනාධාර අරමුදල | 13,11,503 | 65 |
| ආණ්ඩුවේ ව්‍යාපාර රක්ෂණ අරමුදල | 36,45,563 | 87 |
| දේශීය ණය සහ සංවර්ධන අරමුදල | 12,99,215 | 54 |
| රාජ්‍ය සේවා අරථසාධක අරමුදල | 31,02,680 | 03 |
| කුඹුරු අරමුදල | 11,66,563 | 03 |
| රෙජිස්ත්‍රාර් "ප්‍රයිස්" උසාවි ගිණුම | 21,351 | 29 |
| රටබෙරා ගැනීමේ අරමුදල | 6,31,196 | 73 |
| නැව්තොටුපල් අරමුදල | 1,05,082 | 18 |
| ගුරුවරුන්ගේ (වැන්දඹු සහ අනත්දරු) විශ්‍රාම වැටුප් අරමුදල | 1,26,799 | 48 |
| වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල | 1,70,291 | 31 |
| | 1,85,36,558 | 72 |

### 1 (ඊ) ශ්‍රී ලංකා මහා බැංකුවේ විදේශීය ආධාර ප්‍රතිරූපික අරමුදල (බඩුබාහිරාදිය)

| | රු. | ශත |
|---|---|---|
| 1969 ඔක්තෝබර් 1 වැනි දින ශේෂය | 1,85,49,841 | 43 |
| 1969.10.1 සිට 1970.6.30 දිනට ලැබීම් එකතුව | 18,82,56,938 | 69 |
| | 20,68,06,780 | 12 |
| වැය වියදම් පියවීම සඳහා යොදන ලද මුදල අඩුකළ විට | 22,89,00,000 | 0 |
| | *2,20,93,219 | 88 |

*මෙම හිඟ පියවීම සඳහා ප්‍රතිලබ්ධ ඊළඟ කාර්තුවේ ගිණුම් ගත කරනු ලැබේ.

### 1 (උ)—මුදල් සහ බැංකු ශේෂ

| | රු. | ශ. |
|---|---|---|
| කච්චේරි | 2,87,40,840 | 12 |
| මහජන බැංකුවේ මධ්‍යම ගිණුම | 10,00,000 | 0 |
| බොම්බායේ ඉන්දීය රාජ්‍ය බැංකුවේ ජංගම ගිණුම | 14,09,751 | 32 |
| මදුරාසියේ ඉන්දීය රාජ්‍ය බැංකුවේ ජංගම ගිණුම | 1,33,396 | 90 |
| සංක්‍රමණය වෙමින් තිබෙන ප්‍රේෂණ | 43,51,369 | 38 |
| | 3,56,35,357 | 72 |
| අඩු කළා—ශේෂ තාවකාලිකව යෙදවීම | 30,88,888 | 43 |
| | 3,25,46,469 | 29 |
| අඩු කළා—භාණ්ඩාගාරයේ ඌනතාවය | 2,76,53,940 | 72 |
| | 48,92,528 | 57 |

### 1 (ඌ)—නිකුත් නොකළ බඩු බාහිරාදිය සහ ද්‍රව්‍ය

| | රු. | ශ. |
|---|---|---|
| පොදු ගබඩා ගිණුම | 7,00,37,561 | 85 |
| වරායේ වැඩ ගබඩා ගිණුම | 78,45,098 | 54 |
| ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ කර්මාන්තශාලා ගබඩා ගිණුම | 50,60,882 | 31 |
| ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ගබඩා ගිණුම | 33,37,339 | 19 |
| මහා මාර්ග දෙපාර්තමේන්තුවේ ගබඩා ගිණුම | 17,38,921 | 97 |
| ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ගබඩා ගිණුම | 7,75,458 | 03 |
| විදුලි සංදේශ ගබඩා ගිණුම | 58,74,512 | 57 |
| යුද්ධ හමුද ගබඩා ගිණුම | 5,98,394 | 82 |
| වාරිමාර්ග දෙපාර්තමේන්තු ගබඩා ගිණුම | 1,25,24,100 | 25 |
| තැපැල් ගබඩා ගිණුම | 6,23,055 | 07 |
| කෘෂිකර්ම හමුද ගබඩා ගිණුම | 1,535 | 07 |
| ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු ගබඩා ගිණුම | 23,04,229 | 91 |
| ධීවර දෙපාර්තමේන්තු ගබඩා ගිණුම | 10,97,100 | 49 |
| පළාත් පාලන අමාත්‍යාංශය (ජල සම්පාදන ජල ප්‍රවාහණ ගබඩා ගිණුම) | 12,54,020 | 41 |
| රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව—ර.වැ. දෙපාර්තමේන්තුවට ගොඩනැගිලි උපකරණ මිළදී ගැනීමේ ගබඩා ගිණුම | 5,74,944 | 69 |
| | 11,36,47,155 | 17 |

### 1(එ)—ආණ්ඩුවේ දෙපාර්තමේන්තු වලට දී ඇති අත්තිකාරම්

| | රු. ශ. |
|---|---|
| ආහාර සම්පාදන දෙපාර්තමේන්තුව | 3,75,50,415 32 |
| ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | 9,72,32,614 57 |
| විදුලි දෙපාර්තමේන්තුව | 32,12,175 32 |
| අනිකුත් ආණ්ඩු සහ ඒජන්සි | 51,37,942 66 |
| අනිකුත් දෙපාර්තමේන්තු | 45,13,89,640 10 |
| | 59,45,22,787 97 |

### 1(ඒ)—අත්තිකාරම් ගිණුම් වලින් හා අතිරික්ත ශේෂයන්ගෙන් දෙන ලද ණය

| | |
|---|---|
| කෘෂිකාර්මික හා කාර්මික ණයදෙන සංස්ථාව | 2,93,50,000 0 |
| දේශිය ණය සහ සංවර්ධන අරමුදල | 4,02,49,760 0 |
| ආණ්ඩුවේ නිලධාරීන්ට | 6,02,69,758 90 |
| ජාතික සුළු කර්මාන්ත සංයුක්ත මණ්ඩලය | 1,19,25,000 0 |
| ලංකා ධීවර සංස්ථාව | 67,90,000 0 |
| ලංකා රාජ්‍ය වැව්ලි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය | 36,50,646 0 |
| ගල්ඔය සීනි කර්මාන්ත ශාලාව | 30,00,000 0 |
| ලංකා තෙල් සහ මේද සංයුක්ත මණ්ඩලය | 61,70,000 0 |
| ලංකා ගමනා ගමන මණ්ඩලය | 4,34,97,410 95 |
| | 20,49,02,575 85 |

### 1(ඔ)—දේශීය ආයෝජන

| | |
|---|---|
| සීමාසහිත ලංකා ගුවන් සේවයේ කොටස් ප්‍රාග්ධනය | *15,30,000 0 |
| ලංකා බැංකුවේ කොටස් ප්‍රාග්ධනය (ගත් මිළට) | 30,00,000 0 |
| මහජන බැංකුවේ කොටස් ප්‍රාග්ධනය | 30,00,000 0 |
| | 75,30,000 0 |

* මෙම මුදලට අමතරව අංක (II) රජයේ සංස්ථාවල මූලධන යටතේ රු. 44,70,000.00 ඇතුළත් වේ.

### 1970 ජූනි 30න් අවසන් වූ කාර්තුව සඳහා (ඇස්තමේන්තු කළ හා ඇත්ත වශයෙන් ලත්) ලංකාණ්ඩුවේ ආදායම් පිළිබඳ සංසන්ධික ප්‍රකාශය

| ආදායම | ඇස්තමේන්තු කළ රු. ශ. | නියම ආදායම රු. ශ. | වැඩිවීම රු. ශ. | අඩුවීම රු. ශ. |
|---|---|---|---|---|
| ශීර්ෂය | | | | |
| (I) රේගුව | 46,20,00,000 0 | 46,86,88,071 85 | 66,88,071 85 | — |
| (II) නැව්තොට, වරාය, වාප්පුව, ගුදම් යන තැන්වලින් සහ අනිකුත් තැන්වලින් ලැබෙන තීරු ගාස්තු | 28,11,150 0 | 2,86,50,887 0 | 6,39,737 0 | — |
| (III) දේශීය නිෂ්පාදන බදු ආදායම | 52,18,16,250 0 | 48,11,45,706 23 | — | 4,06,70,543 77 |
| (IV) ආදායම් බදු, මුදල් බදු, මුද්දර, අධික ලාභ බද්ද ආදිය | 28,05,18,000 0 | 31,44,02,966 53 | 3,38,84,966 53 | — |
| (V) වෙනත් ලෙසින් වර්ග කර නොමැති බලපත්‍ර හා අභ්‍යන්තර ආදායම | 3,60,27,075 0 | 3,70,39,316 19 | 10,12,241 19 | — |
| (VI) උසාවි හෝ කාර්යාල ගාස්තු සහ විශේෂ සේවයන් සඳහා ගෙවීම් | 2,30,13,157 50 | 1,44,29,458 33 | — | 85,83,699 17 |
| (VII) සෞඛ්‍ය සේවා | 52,34,475 0 | 56,14,344 13 | 3,79,869 13 | — |
| (VIII) වැය මුදල් ආපසු ගෙවීම | 1,81,67,100 0 | 2,43,36,256 27 | 61,69,156 27 | — |
| (IX) තැපැල් සහ විදුලි සංදේශ සේවා | 5,85,14,250 0 | 4,89,11,896 45 | — | 96,02,353 55 |
| (X) පොලි, වාර්ෂික මුදල්, ලාභාංශ ආදිය | 7,39,44,075 0 | 2,99,42,527 55 | — | 4,40,01,547 45 |
| (XI) විවිධ ආදායම් | 5,91,54,750 0 | 5,35,89,757 17 | — | 55,64,992 83 |
| (XII) ඉඩකඩම් ආදායම් | 56,41,500 0 | 1,01,67,046 67 | 45,25,546 67 | — |
| (XIII) ඉඩකඩම් විකිණීම් | 30,12,862 50 | 50,17,749 96 | 20,04,887 46 | — |
| (XIV) විදේශ විනිමය හිමිකම් සහතික විකිණීමෙන් ලැබීම් | 40,50,00,000 0 | 33,08,48,680 75 | — | 7,41,51,319 25 |
| (XV) දුම්රිය දෙපාර්තමේන්තුවේ ආදායම | 8,30,25,000 0 | 8,48,92,714 98 | 18,67,714 98 | — |
| (XVI) විදුලි දෙපාර්තමේන්තුවේ ආදායම | 6,23,62,500 0 | 35,16,825 93 | — | 5,88,45,674 07* |
| එකතුව | 2,12,54,42,145 0 | 1,94,11,94,205 99 | 5,71,72,191 08 | 24,14,20,130 09 |
| වැඩිවීම අඩුකළ විට | | | | 5,71,72,191 08 |
| ශුද්ධ අඩුවීම | | | | 18,42,47,939 01 |

*විදුලි දෙපාර්තමේන්තුව, 1969.11.1 දින සිට 'ලංකා විදුලිබල මණ්ඩලය' බවට පත්කිරීම නිසා මෙම අඩුවීම ඇතිවිය.

සී. ඒ. කුරේ,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

1970 ඔක්තෝබර් මස 8 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

**1970 ජූනි 30 වැනි දිනට අවසාන තුන්වැනි කාර්තුව වෙනුවෙන් ඇස්තමේන්තු කරන ලද හා නියම වියදම් දක්වෙන සංසන්දික ප්‍රකාශය**

| | කාණ්ඩය | ඇස්තමේන්තු කළ රු. ශ. | නියම රු. ශ. | වැඩිවීම රු. ශ. | අඩුවීම රු. ශ. |
|---|---|---|---|---|---|
| 1. | අග්‍රාණ්ඩුකාරතුමා, උත්තර මන්ත්‍රණ සභාව, ගණන් පරීක්ෂක, නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සභානායකගේ කාර්යාලය යනාදිය | 2,80,90,872 0 | 2,06,23,175 61 | ... | 74,67,696 39 |
| 2. | අග්‍රමාත්‍ය සහ ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය | 12,34,26,717 0 | 11,80,47,276 36 | ... | 53,79,440 64 |
| 3. | ක්‍රම සම්පාදක හා රැකීරක්ෂා අමාත්‍යාංශය | 76,25,544 0 | 56,95,872 85 | ... | 19,29,671 43 |
| 4. | වාරිමාර්ග, විදුලි බල හා මහා මාර්ග අමාත්‍යාංශය | 37,97,96,271 75 | 20,80,04,869 71 | ... | 17,17,91,402 04 |
| 5. | විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශය | 30,39,60,725 25 | 16,72,45,180 45 | ... | 13,67,15,544 80 |
| 6. | අධ්‍යාපන අමාත්‍යාංශය | 37,61,41,909 50 | 37,08,22,036 92 | ... | 53,19,872 58 |
| 7. | වෙළඳ හා නැව් කටයුතු අමාත්‍යාංශය | 4,97,92,188 0 | 3,93,45,528 94 | ... | 1,04,46,659 06 |
| 8. | කම්කරු අමාත්‍යාංශය | 99,13,977 75 | 81,69,010 21 | ... | 17,44,967 54 |
| 9. | රාජ්‍ය පරිපාලන පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 24,24,84,196 50 | 23,28,45,728 07 | ... | 96,38,468 43 |
| 10. | කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශය | 12,78,00,482 25 | 7,72,57,956 46 | ... | 5,05,42,525 79 |
| 11. | මුදල් අමාත්‍යාංශය | 65,19,70,545 75 | 40,75,44,888 41 | ... | 24,44,25,657 34 |
| 12. | ප්‍රවාහණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය | 13,54,89,846 0 | 11,95,29,646 0 | ... | 1,59,60,200 0 |
| 13. | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | 2,16,00,015 0 | 1,35,49,090 0 | ... | 80,50,925 0 |
| 14. | අධිකරණ අමාත්‍යාංශය | 2,21,34,431 25 | 2,21,40,972 60 | 6,541 35 | — |
| 15. | කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය | 17,03,77,707 0 | 13,51,68,672 83 | ... | 3,52,09,034 17 |
| 16. | ධීවර අමාත්‍යාංශය | 42,31,923 0 | 30,29,462 56 | ... | 12,02,460 44 |
| 17. | නිවාස හා ගොඩනැගිලි අමාත්‍යාංශය | 4,17,19,755 75 | 2,65,51,398 21 | ... | 1,51,63,357 54 |
| 18. | තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යාංශය | 8,28,83,277 0 | 7,93,31,723 25 | ... | 35,51,553 75 |
| 19. | සෞඛ්‍ය අමාත්‍යාංශය | 17,28,33,092 25 | 16,75,00,747 13 | ... | 53,32,345 12 |
| 20. | ප්‍රවෘත්ති හා ගුවන් විදුලි අමාත්‍යාංශය | 1,66,46,756 25 | 1,54,67,035 31 | ... | 11,79,720 94 |
| 21. | සමාජ සේවා අමාත්‍යාංශය | 2,47,33,246 50 | 2,86,38,095 0 | 39,04,848 50 | — |
| 22. | සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 40,69,829 25 | 34,46,342 52 | ... | 6,23,486 73 |
| 23. | පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය | 16,85,058 0 | 14,14,028 54 | ... | 2,71,029 46 |
| | | 2,99,94,08,367 0 | 2,27,13,68,737 66 | 39,11,389 85 | 73,19,51,019 19 |
| | | | වැඩිවීම අඩුකළ විට | | 39,11,389 85 |
| | | | ශුද්ධ අඩුවීම | | 72,80,39,629 34 |

1970.6.2 දින අංක 14,908/6 දරණ රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීම ප්‍රකාර, අමාත්‍යාංශවලට දෙපාර්තමේන්තු බෙද වෙන් කිරීම අනුව, මෙම වර්ග කිරීම කර ඇත.

සී. ඒ. කුරේ,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

1970 ඔක්තෝබර් මස 8 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දීය.
10–580

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## පුත්තලම් පාලන දිස්ත්‍රික්කයේ 1971 වර්ෂයට තුවක්කු බලපත්‍ර අළුත් කිරීම

පුත්තලම් පාලන දිස්ත්‍රික්කයේ ලියා පදිංචි කොට ඇති තුවක්කු බලපත්‍ර 1971 වර්ෂයට අලුත් කිරීම 1970 නොවැම්බර් මස 1 වැනි දින සිට ඒ ඒ කෝට්ඨාශවල ප්‍රාදේශීය ආදායම් නිලධාරීන් විසින් කර ගෙන යනු ලබන බව මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ. එසේ හෙයින් මේ සම්බන්ධ සියලුම ඉල්ලුම්පත් ඒ ඒ ප්‍රාදේශීය ආදායම් නිලධාරීන් වෙත යැවිය යුතුය. තමන්ගේ තුවක්කු බලපත්‍ර 1970 දෙසැම්බර් මස 31 වැනි දින හෝ ඊට කලින් අළුත් කර ගන්නා ලෙස මහජනතාවට මෙයින් දැනුම් දෙනු ලැබේ. 1971 වර්ෂයට තුවක්කු බලපත්‍ර නිකුත් කිරීමට ප්‍රථම 1970 තුවක්කු බලපත්‍රයත් ඊට අයත් තුවක්කුවත් බලපත්‍ර අලුත් කරන නිලධාරීතැනගේ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කළ යුතුය. ඉහත සඳහන් දිනෙන් පසු බලපත්‍ර අළුත් කර ගන්නා තැනැත්තන් බලපත්‍ර ගාස්තුවට සමාන දඩ මුදලක් ද ගෙවිය යුතු බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. යම් තුවක්කු බලපත්‍රයක් 1971 වර්ෂයට අළුත් නොකිරීමට බලාපොරොත්තු වන්නේ නම් හෝ අබලන් තුවක්කු ඇත් නම් හෝ ඒවා ඊට අදාල බලපත්‍ර ද සමග බලපත්‍ර අළුත් කරන නිලධාරී තැනට නැත් නම් මෙම කාර්යාලයට 1970 දෙසැම්බර් මස 31 වෙනි දිනට ප්‍රථම භාරදිය යුතුය.

3. 1971 මාර්තු 31 වෙනි දිනට හෝ ඊට කලින් අළුත් කරවා නොගත් සෑම තුවක්කු බලපත් හිමියෙකුටම විරුද්ධව නඩු පවරන බවද මෙයින් දැනුම් දෙනු ලැබේ.

පී. ජී. ප්‍රංචිහේවා,
පුත්තලමේ දිසාපති,

1970 ඔක්තෝබර් මස 9 වැනි දින,
පුත්තලමේ දිසාපති කාර්යාලයේ දීය.

## 1971 වර්ෂය සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ තුවක්කු බලපත්‍ර අළුත්වැඩියා කිරීම

යොමු අංකය: 1/59/7267.

1971 වර්ෂය සඳහා තුවක්කු බලපත්‍ර අළුත්වැඩියා කිරීම 1970 නොවැම්බර් මස 1 වැනි දින සිට ඇරඹිත වේ. බලපත්‍ර අයිතිකරුවන් ඔවුන් පදිංචි ප්‍රදේශයේ ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කාර්යාලයෙන් බලපත්‍ර අළුත්වැඩියා කර ගත යුතුය. එම කාර්යාලය විසින් 1971.3.31 වැනි දින දක්වා බලපත්‍ර අළුත්වැඩියා කෙරේ. එයින් පසුව බලපත්‍ර අළුත්වැඩියා කෙරෙන්නේ කුරුණෑගල කච්චේරිය මඟින්ය. ඒ ඒ ප්‍රදේශ භාර ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි වරුන්ගේ ලිපිනයන් පහත දැක්වේ.

(1) දඹදෙනි හත්පත්තුවේ ප්‍රා. ආ. නි.—පොල්ගහවෙල.
(2) දේවමැදි හත්පත්තුවේ ප්‍රා. ආ. නි.—වාරියපොල.
(3) හිරියාල හත්පත්තුවේ ප්‍රා. ආ. නි.—ඉබ්බාගමුව.
(4) කුලියාපිටිය ප්‍රා. ආ. නි.—කුලියාපිටිය.
(5) පන්නල ප්‍රා. ආ. නි.—පන්නල.
(6) බිංගිරිය ප්‍රා. ආ. නි.—බිංගිරිය.
(7) නිකවැරටිය ප්‍රා. ආ. නි.—නිකවැරටිය.
(8) ගල්ගමුව ප්‍රා. ආ. නි.—ගල්ගමුව.
(9) මහව ප්‍රා. ආ. නි.—මහව.
(10) ප්‍රා. ආ. නි. කුරුණෑගල.—කුරුණෑගල.
(11) මාවතගම ප්‍රා. ආ. නි.—මාවතගම.

2. බලපත්‍ර ගාස්තු වශයෙන් මුද්දර භාරගනු නොලැබේ. පැරණි බලපත්‍ර නැතිවී නම්, ඒ වෙනුවට රුපියලක් ගෙවා නැතිවූ තුවක්කු බලපත්‍රය වෙනුවට දෙන සහතිකයක් ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගෙන් ලබාගත යුතුයි. පැරණි බලපත්‍ර හෝ නැතිවූ තුවක්කු

බලපත්‍රය වෙනුවට දෙන සහතිකය හෝ ඉදිරිපත් නොකළ අයට අළුත් බලපත්‍රයක් නිකුත් කරනු නොලැබේ. **ඉහත සඳහන් කාල සීමාව තුළදී බලපත්‍ර අළුත්වැඩියා කිරීම කුරුණෑගල කච්චේරියේදී කරනු නොලැබේ.** 1970 දෙසැම්බර් මස 31 වැනි දිනට ප්‍රථමයෙන් නව වර්ෂය සඳහා අළුත් බලපත්‍රයක් නොගත් අයට බලපත්‍ර ගාස්තුවට සමාන දඩ මුදලකට යටත් වීමට සිදුවේ. 1971 මාර්තු 31 වැනිදාට ප්‍රථමයෙන් බලපත්‍ර අළුත්වැඩියා නොකළ අයට නීති මාර්ගයෙන් දඩුවම් පමුණුවනු ලැබේ.

3. අළුත්වැඩියා කිරීමට ඉදිරිපත් කරන බලපත්‍ර වලට අයත් තුවක්කු එම බලපත්‍ර අළුත් කිරීමට මවිසින් බලය දී ඇති නිලධාරි තැන වෙත, බලපත්‍ර නිකුත් කිරීමට පෙර පරීක්ෂා කිරීම පිණිස ඉදිරිපත් කළ යුතුයි. යම් තුවක්කුවක් පාවිච්චි නොකළ හැකි තත්ත්වයක තිබේ නම්, 1970 වර්ෂයට නිකුත් කර තිබෙන බලපත්‍ර යත් සමඟ ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනට 1970 දෙසැම්බර් මස 31 වැනි දිනට ප්‍රථමයෙන් භාරදිය යුතුයි. එසේ නොකළහොත් 1971 වර්ෂයට බලපත්‍රයක් ලබාගැනීමට සිදුවේ.

ජී. බ. දිසානායක,<br>
කුරුණෑගල දිස්ත්‍රික්කයේ දිසාපති.

1970 ඔක්තෝබර් මස 9 වැනි දින,<br>
කුරුණෑගල කච්චේරියේ දීය.

10-721

---

## අනුරාධපුර දිස්ත්‍රික්කයේ තුවක්කු බලපත්‍ර 1971 වර්ෂය සඳහා අළුත්වැඩියා කිරීම

ගිණි අවි ආඥාපනත යටතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි 1971 වර්ෂය සඳහා තුවක්කු බලපත්‍ර අළුත්වැඩියා කිරීම ප්‍රාදේශීය ආදායම් නිලධාරීන් විසින් 1970 නොවැම්බර් මස 1 වැනි දින සිට ආරම්භ කරනු ලැබේ.

2. ගිණි අවි සඳහා නිකුත් කර ඇති සෑම බලපත්‍රයක්ම 1970 දෙසැම්බර් මස 31 වැනි දිනට පෙර 1971 වර්ෂය සඳහා අලුත්වැඩියා කරගන්නා ලෙස මෙයින් දන්වනු ලැබේ. බලපත්‍ර අළුත්වැඩියා කිරීමේදී පරණ බලපත්‍ර සෝදිසි කිරීම පිණිස අදාල තුවක්කු ඒ ඒ නිලධාරීන් වෙත ඉදිරිපත් කළ යුතුය.

3. යමෙකු 1970 දෙසැම්බර් මස 31 වැනි දිනට ප්‍රථම බලපත්‍ර අලුත් වැඩියා කර නොගත්තොත්, එවැනි බලපත්‍රයක් නියමිත කාලයෙන් පසුව අලුත් කිරීමේදී බලපත්‍ර ගාස්තුව සියයට සියයක් දඩ මුදලක් වශයෙන් ගෙවා අලුත්වැඩියා කරගැනීමට සිදුවේ. 1971 වර්ෂය සඳහා යම් කිසි හේතුවක් නිසා බලපත්‍ර අලුත්වැඩියා කර ගැනීමට බලාපොරොත්තු නොවන්නේ නම් එම බලපත්‍රයද තුවක්කුවද බලපත්‍රය නිකුත් කරන නිලධාරියා වෙත 1970 දෙසැම්බර් මස 31 වැනි දින හෝ ඊට පෙර භාර දිය යුතුයි.

4. 1970 වර්ෂයට නිකුත් කරන ලද තුවක්කු බලපත්‍රය, බලපත්‍ර නිකුත්කරන නිලධාරිතැනට ඉදිරිපත් කිරීම සඳහා යමෙකු ලඟ නොමැතිනම් නැතිවූ බලපත්‍ර සහතිකයක් ලබාගැනීම සඳහා රුපියලක් ගෙවන්නට සිදුවේ.

5. 1971 මාර්තු 31 වැනි දිනට පෙර තුවක්කු බලපත්‍ර අලුත්වැඩියා කර නොගන්නා අයට විරුද්ධව නීති මාර්ගයෙන් කටයුතු කරනා බව මෙයින් දන්වනු ලැබේ.

ඒ. පී. බී. මහම්පේ ඊ,<br>
අනුරාධපුර දිසාපති.

1970 ඔක්තෝබර් මස 11 දින,<br>
අනුරාධපුර දිසාපති කාර්යාලයේදීය.

10-801

---

## මාතලේ දිස්ත්‍රික්කයේ තුවක්කු බලපත්‍ර අළුත් කිරීම— 1971 වර්ෂය

මාතලේ දිස්ත්‍රික්ක රිවෝල්වර සහ පිස්තෝල හැර, අනිකුත් තුවක්කු බලපත්‍ර 1971 වර්ෂය සඳහා අළුත් කිරීම ඒ ඒ කොට්ඨාශ වල ප්‍රාදේශීය ආදායම් නිලධාරීන් විසින් 1970 නොවැම්බර් 15 වෙනි දින සිට කරනු ලබන බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ. රිවෝල්වර් සහ පිස්තෝල බලපත්‍ර අළුත් කිරීම මාතලේ දිසාපති කාර්යාලයේදී ඉහත සඳහන් දින සිට කරනු ලැබේ.

2. තුවක්කු සඳහා දී ඇති සෑම බලපත්‍රයක්ම, 1970 දෙසැම්බර් 31 වෙනි දාට පෙර 1971 වර්ෂය සඳහා අළුත් කරගන්නා ලෙස අවවාද වශයෙන් දන්වනු ලැබේ. බලපත්‍ර අළුත්කිරීමේදී පරණ බලපත්‍රද, සෝදිසි කිරීම සඳහා ඒ බලපත්‍රවල සඳහන් තුවක්කුද ඉදිරිපත් කළ යුතුයි. පිස්තෝල සහ රිවෝල්වර් මගේ පරීක්ෂාව සඳහා ඉදිරිපත් කළ යුතු අතර, අනෙක් අවි ඒ ඒ ප්‍රාදේශීය ආදායම් නිලධාරීන්ට ඉදිරිපත් කළ යුතුයි.

3. යමෙකු 1970 දෙසැම්බර් 31 වෙනි දිනට ප්‍රථම බලපත්‍ර අළුත් කැර නොගන්නේ නම්, එවැනි බලපත්‍රයක් නියමිත කාලයෙන් පසුව අළුත් කිරීමේදී බලපත්‍ර ගාස්තුව මෙන් 100% ක අතිරේක දඩ මුදලක් ගෙවා අළුත් කර ගන්නට සිදුවේ. තුවක්කුව පාවිච්චියට නුසුදුසු තත්ත්වයක තිබීම නිසා හෝ වෙනයම් හේතුවක් නිසා හෝ සිය බලපත්‍රය 1971 වර්ෂයට අළුත් නොකිරීමට තීරණය කර ඇති සියළුම තුවක්කු බලපත්‍ර හිමියන්, ඒ බලපත්‍රයද, තුවක්කුවද, ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැන වෙත හෝ මා වෙත හෝ 1970 දෙසැම්බර් 31 වෙනි දිනට පෙර භාරදිය යුතුයි.

4. 1970 වර්ෂයට නිකුත් කරනලද තුවක්කු බලපත්‍රයක්, බලපත්‍ර නිකුත් කරන නිලධාරිතැනට බාරදීම පිණිස යමෙකු ලඟ නැති නම්, එවැනි බලපත්‍රයක සහතික පිටපතක් නිකුත් කිරීම සඳහා නියමිත බලපත්‍ර ගාස්තුවට අතිරේකව තවත් රුපියලක්ද ගෙවීමට සිදුවේ.

5. 1971 මාර්තු මස 31 වෙනි දිනට ප්‍රථම තුවක්කු බලපත්‍ර අළුත් කර නොගන්නා අයට විරුද්ධව නඩු පවරණු ලබන බවද සැලකිය යුතුයි.

එච්. ඒ. පී. අභයවර්ධන,<br>
මාතලේ පාලන දිස්ත්‍රික්කයේ දිසාපති හා<br>
බලපත්‍ර අධිකාරි.

දිසාපති කාර්යාලය,<br>
මාතලේ, 1970. 10. 13.

10-843

---

## කොළඹ දිස්ත්‍රික්කය

### 1971 වර්ෂයට තුවක්කු බලපත්‍ර අළුත් කිරීම

තුවක්කු හිමියන් විසින් 1971 වර්ෂයට බලපත්‍ර අළුත් කිරීම පිණිස 1970 නොවැම්බර් මස 1 වෙනි දින සිට දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලයතුළ ඉල්ලුම් කළ යුතුය. **1970 බලපත්‍රය හා ගිනි අවියද ඒ සමග ඉදිරිපත් කළ යුතු වේ.** එම බලපත්‍රය නොමැතිනම් පිටපතක් සඳහා රුපියලක (1.00) අතිරේක මුදලක් අයකරනු ලැබේ. 1970 දෙසැම්බර් මස 31 වෙනි දිනට පෙර බලපත්‍ර අළුත්කර නො ගතහොත් බලපත්‍ර ගාස්තුවට සමාන මුදලක් දඩ වශයෙන් අයකරනු ලැබේ.

2. කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරිතුමාගේ කොට්ඨාශයට ඇතුලත්වන කොළඹ මහ නගර සභාව, දෙහිවල-ගල්කිස්ස මහ නගර සභාව, කෝට්ටේ සහ කොලොන්නාව පළාත් ආණ්ඩු සභා සීමාවන් තුළ, මහරගම සුළු නගර සභා සීමාව තුළ, කොටිකාවත්ත (බටහිර හේවාගම් කෝරළය ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පල්ලේ පත්තුවේ අංක 491 දරණ ග්‍රාමසේවක කොට්ඨාශය හැර), මුල්ලේරියාව සුළු නගර සභාව, (බටහිර හේවාගම් කෝරළේ අංක 501 දරන මුල්ලේරියාව උතුර ග්‍රාමසේවක කොට්ඨාශය, අංක 502 දරන මුල්ලේරියාව-උඩුමුල්ල ග්‍රාමසේවක කොට්ඨාශය, අධිකාරි පත්තුවේ අංක 503 දරන මුල්ලේරියාව-හිඹුටාන ග්‍රාමසේවක කොට්ඨාශය සහ පල්ලේ පත්තුවේ අංක 475 දරන වැලිවිට ග්‍රාමසේවක කොට්ඨාශය හැර) සහ කෝට්ටේ-ගල්කිස්ස ගම් සභා සීමාතුළ පදිංචි තුවක්කු හිමියන් විසින් තමන්ගේ බලපත්‍ර අළුත්කර ගැනීම සඳහා කොළඹ කච්චේරියේ දී මා වෙත ඉල්ලුම් කළ යුතුය.

3. දෙවෙනි ඡේදයේ දැක්වෙන ප්‍රදේශවල පදිංචි නොමැති තුවක්කු අවි හිමියන් විසින් තමන් පදිංචි කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි වෙත ඉල්ලුම් කළ යුතුය.

4. ගෙවිය යුතු නියමිත බලපත්‍ර ගාස්තු පහත දැක්වේ :—

| | | රු. ශ. |
|---|---|---|
| (1) | බෙහෙත් කොටන තනි කානුවේ තුවක්කුවකට ... | 1 00 |
| (2) | බෙහෙත් කොටන කානු දෙකේ තුවක්කුවකට ... | 2 00 |
| (3) | තනි කානුවේ පතරොන් තුවක්කුවකට ... | 2 50 |
| (4) | කානු දෙකේ පතරොන් තුවක්කුවකට ... | 5 00 |
| (5) | කානු තුනේ පතරොන් තුවක්කුවකට ... | 7.50 |
| (6) | රයිපලයකට (හුලං රයිපලයත් ඇතුළුව) ... | 10 00 |
| (7) | පිස්තෝලයකට හෝ රිවෝල්වරයකට ... | 25 00 |

ඇල්. පී. වික්‍රමාරච්චි,<br>
වැඩ බලන කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපති.

1970 ඔක්තෝබර් 16 දින,<br>
කච්චේරිය, කොළඹ.

10-866

2175.

## ලංකා රජයේ උකස් බැංකුව

ලංකා රජයේ උකස් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 1970 අප්‍රේල් මස 25 වෙනි දින පවත්වන ලද රැස්වීමේදී පහත සඳහන් පරිදි විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කර සම්මත කරන ලදී.

1. එෆ්. ඩී. එල්. කොක් ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද 1954 ජූලි 26 වෙනි දින හා අංක 447 දරණ උගස්කරය මත, වැල්ලවත්තේ, දේවස්ථාන පටුමගේ, කෝලන් කඩුව පෙදෙසේ, අංක 3 දරණ තැන පදිංචි ඩයස් අභයදීර මහතාගෙන් 1970.3.1 දින දක්වා මුල් මුදල හා පොලිය වශයෙන් රු. 11,967.26 ක මුදලක් හා 1970.3.2 දින සිට ගෙවනු ලබන දින තෙක් රු. 8,015.91 ක මුදල මත අවුරුද්දට සියයට $5\frac{1}{2}$ බැගින් පොලියත්, රු. 97 ක මුදලට අවුරුද්දට සියයට $4\frac{1}{2}$ බැගින් පොලියත් තවදුරටත් ලැබිය යුතුය.

2. 1968 අංක 33 දරණ ලංකා රජයේ උකස් බැංකු සහ මුදල් (සංශෝධන) පනතින් සංශෝධිත ලංකා රජයේ උකස් බැංකු ආඥ පනතේ (398 අධිකාරය) 61ඩී වගන්තියේ ප්‍රකාර පහත සඳහන් ඉඩ්පොල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ, අළුත්කඩේ වීදියේ අංක 227 දරණ තැන, පී. එච්. විජේසිංහ වෙන්දේසිකරුට අවසරය හා බලය දෙන ලදී.

(1) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හා මහනගර සභා සීමාව තුළ, උතුරු වැල්ලවත්ත කොට්ඨාශයේ, පළමුවෙනි දේවස්ථාන පටුමගට ඔබ්බෙන් කෝලංකඩුව පෙදෙසේ පිහිටි වරිපනම් අංක 3 දරණ, බලය ලත් මිනින්දෝරු එච්. දොන් ඩේවිඩ් මහතා විසින් 193- මැයි 27 වෙනි දින සාදන ලද අංක 2354 දරණ පිඹුරේ අංක 3 දරණ බිම්කොටස යනුවෙන් ලකුණුකර ඇති (අංක 2 දරණ ලියාපදිංචි පිඹුරෙහි කෝලංකඩුව ඕවිට නොහොත් කෝලංකඩුවවත්ත නමැති ඉඩමේ අංක 58 සහ 60 දරණ ඒකාබද්ධ බිම් කොටස් වලින් බෙදා වෙන් කරන ලද කොටසක්) පර්චස් විසිතුනයි දශම හතයි පහ (අ. 0, රූ. 0, ප. 23.75) ක ප්‍රමාණයෙන් යුත් ඉඩම එහි පිහිටි ගොඩනැගිලි හා ගහකොළ වැවිලි සමග.

(2) ඉහත කී උතුරු වැල්ලවත්ත කොට්ඨාශයේ, කෝලංකඩුව පෙදෙසේ පිහිටි, ඉහත සඳහන් පිඹුරේ අංක 16 දරණ පාරකට වෙන් කරන ලද බිම් කොටස යනුවෙන් ලකුණු කර ඇති, (අංක 2 දරණ ලියාපදිංචි පිඹුරෙහි කෝලංකඩුව ඕවිට නොහොත් කෝලංකඩුවවත්ත නමැති ඉඩමේ අංක 58 සහ 60 දරණ ඒකාබද්ධ බිම් කොටස් වලින් බෙදා වෙන් කරන කොටසක්) රූඩ් දෙකයි පර්චස් දහහතයි දශම හයයි තුන (අ. 0, රූ. 2, ප. 17.63) ක ප්‍රමාණයෙන් යුත් බිම් කොටස.

එෆ්. ඩී. එල්. කොක්, ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1954 ජූලි 26 වෙනි දින සහතික කරන ලද අංක 447 දරණ උගස්කරය පිට, ඩයස් අභයදීර මහතා විසින් මෙම බැංකුවට ඇප වශයෙන් තබා ඇති ඉහත කී ඉඩම, එකී උගස්කරය පිට රු. 11,967.26 ක මුදලක් හා 1970.3.2 දින සිට වෙන්දේසිය පැවැත්වෙන දින තෙක් රු. 8,015.91 ක මුදල මත අවුරුද්දට සියයට $5\frac{1}{2}$ බැගින් පොලියත්, රු. 97 ක මුදලට අවුරුද්දට සියයට $4\frac{1}{2}$ බැගින් පොලියත්, ලංකා රජයේ උකස් බැංකු ආඥපනතේ 63 වෙනි වගන්තිය යටතේ අය කරගත හැකි මුදල් හා වියහියදම් ද අයකර ගනු සඳහා.

1970 ජූලි 22 දින,
කොළඹ දීය.

එච්. බී. කපුවත්තේ,
සාමාන්‍යාධිකාරී.

10-825

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

### දුම්රිය හරස් පාරවල් අළුත්වැඩියා කිරීම

උතුරු දුම්රිය මාර්ගයේ කුරුණෑගල සහ වැල්ලව දුම්රිය ස්ථාන අතර දුම්රිය සැතපුම් 60 දම්වැල් 12 හි පිහිටි කොළඹ ත්‍රිකුණාමලය මහා මාර්ගයෙහි සැතපුම් $59\frac{1}{4}$ සහ සැතපුම් $59\frac{1}{2}$ කණු අතර පිහිටි දුම්රිය හරස් පාර අළුත්වැඩියා කරනු ලබන හෙයින් 1970. 11. 6 වෙනි සිකුරාදා පෙරවරු 7 සිට එදින පස්වරු 11 දක්වා සහ 1970. 11. 7 වෙනි සෙනසුරාදා පෙරවරු 5 සිට එදින පස්වරු 6 දක්වා අර්ධ වශයෙන්ද 1970. 11. 6 වෙනි සිකුරාදා පස්වරු 11 සිට 1970. 11. 7 වෙනි සෙනසුරාදා පෙරවරු 5 දක්වා සම්පූර්ණයෙන් ද රථවාහන ගමනාගමනයට වසා තබනු ලැබේ. අර්ධ වශයෙන් වසා තබන කාලය තුළදී මෙම හරස් මාර්ග ඔස්සේ රථවාහන ගමන් කළ හැකිය. සම්පූර්ණයෙන් වසා තබන කාලය තුළදී රථවාහන ගමනාගමනය ඉබ්බාගමුව, හිරිපිටිය හරහා කුරුණෑගලටත්, බඩගමුව, වැල්ලව හරහා කුරුණෑගලටත් වෙනස් කරනු ලැබේ.

ජේ. පෝල් සෝනානරත්න,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

10-854

---

## විවාහ සිදුකිරීම සඳහා දේවස්ථානය ලියාපදිංචි කිරීම

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥපනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තියේ විධිවිධාන අනුව ෂහුල් හමීඩ් මොහමඩ් සුබෙයිර් ෆාරුක් නමැති ලංකාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් වන මම, ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැණෙන පහත සඳහන් කරනු ලබන ගොඩනැගිල්ල විවාහ සිදුකිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව මෙයින් දනුම් දෙනු ලැබේ.

| අංකය | ලියාපදිංචි කිරීමේ දිනය | විස්තරය | පිහිටීම | දේවගැතිතැන, අයිතිකරු හෝ භාරකරු | ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන්ද |
|---|---|---|---|---|---|
| 983 ... | 12.10.70 | ... සාන්ත අන්තෝනි මුනිඳුන්ගේ දේවස්ථානය ... | දික්ඔවිට හැඳල වත්තල | ගරු සික්ස්ටස් කුරුකුල කුලසූරිය | රෝමානු කතෝලික |

හමීඩ් ෆාරුක්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ කාර්‍යාලය,
කොළඹ, 1970 ඔක්තෝබර් 12.

10—868

---

## විවාහ සිදුකිරීම සඳහා දේවස්ථානය ලියාපදිංචි කිරීම

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥපනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තියේ විධිවිධාන අනුව ෂහුල් හමීඩ් මොහමඩ් සුබෙයිර් ෆාරුක් නමැති ලංකාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් වන මම, ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත සඳහන් කරනු ලබන ගොඩනැගිල්ල විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව මෙයින් දනුම් දෙනු ලැබේ.

| අංකය | ලියාපදිංචි කිරීමේ දිනය | විස්තරය | පිහිටීම | දේවගැතිතැන, අයිතිකරු හෝ භාරකරු | ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන්ද |
|---|---|---|---|---|---|
| 984 ... | 10.12.70 | ... ලංකා පැන්තකොස්ත මිසමේ දේවස්ථාන ශාලාව | 55, හිරගෙදර පාර, කළුවැල්ල, ගාල්ල | ගරු එච්. ඩී. පෝල් ... | ලංකා පැන්තකොස්ත මිසම |

හමීඩ් ෆාරුක්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ කාර්‍යාලය,
කොළඹ, 1970 ඔක්තෝබර් 12.

10—869

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට හැකෙන වේලාවක් ද තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාක් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුයි.

### උපලේඛනය

### 1970

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| ජූලි ... | 70. 7. 2 බ්‍රහස්පතින්ද ... | 70. 6.25 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.10 සිකුරාද ... | 70. 7. 2 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.17 සිකුරාද ... | 70. 7.10 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.24 සිකුරාද ... | 70. 7.17 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.31 සිකුරාද ... | 70. 7.24 සිකුරාද | දහවල් | 12.0 |
| අගෝස්තු ... | 70. 8. 7 සිකුරාද ... | 70. 7.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 8.14 සිකුරාද ... | 70. 8. 7 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.21 සිකුරාද ... | 70. 8.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.28 සිකුරාද ... | 70. 8.21 සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් ... | 70. 9. 4 සිකුරාද ... | 70. 8.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.11 සිකුරාද ... | 70. 9. 4 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.18 සිකුරාද ... | 70. 9.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.25 සිකුරාද ... | 70. 9.18 සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් ... | 70.10. 2 සිකුරාද ... | 70. 9.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10. 9 සිකුරාද ... | 70.10. 2 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.16 සිකුරාද ... | 70.10. 9 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.23 සිකුරාද ... | 70.10.16 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.30 සිකුරාද ... | 70.10.23 සිකුරාද | ප.ව. | 3.30 |
| නොවැම්බර් ... | 70.11. 5 බ්‍රහස්පතින්ද ... | 70.10.30 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.11.12 බ්‍රහස්පතින්ද ... | 70.11. 5 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.20 සිකුරාද ... | 70.11.12 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.27 සිකුරාද ... | 70.11.20 සිකුරාද | දහවල් | 12.0 |
| දෙසැම්බර් ... | 70.12. 4 සිකුරාද ... | 70.11.27 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.11 සිකුරාද ... | 70.12. 4 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.18 සිකුරාද ... | 70.12.10 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.24 බ්‍රහස්පතින්ද ... | 70.12.17 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.31 බ්‍රහස්පතින්ද ... | 70.12.24 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 ජූනි 2 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි.